# 7 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

(2016 වසරේ සිට ක්‍රියාත්මක වේ.)

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**ජාතික අධ්‍යාපන ආයතනය**

මහරගම, ශ්‍රී ලංකාව

**Web|** www.nie.lk **Email|** info@nie.lk

# බුද්ධ ධර්මය
## ගුරු මාර්ගෝපදේශය
## 7 ශ්‍රේණිය

**(2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

**ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**ශ්‍රී ලංකාව**

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

බුද්ධ ධර්මය

7 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2016

C ජාතික අධ්‍යාපන ආයතනය

ISBN: ......................

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය :
මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2016 වර්ෂයේ දී හත්වන සහ එකොළොස්වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන් හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන , පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුවද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය
ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය** : කථිකාචාර්ය, පූජ්‍ය උඩුගම සුදස්සී හිමි
ව්‍යාපෘති නායක

**විෂය කමිටුව** :

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හිටපු කථිකාචාර්ය
අතිපූජ්‍ය ගන්තුනේ අස්සජී මහානායක හිමිපාණෝ
සබරගමුව පළාත් බුද්ධ ධර්මය විෂය අධ්‍යක්ෂ පූජ්‍ය කණුගල පඤ්ඤාලංකාර හිමිපාණෝ
අධ්‍යාපන අමාත්‍යාංශයේ ආගමික හා සාරධර්ම අධ්‍යාපන ශාඛාවේ
අධ්‍යාපන අධ්‍යක්ෂ එස්.බී.එම්. නිමල් ධර්මසිරි මහතා
කෑගල්ල අධ්‍යාපන කලාපයේ ගුරු උපදේශක ඩබ්.ඒ.සී. වේරගොඩ මහත්මිය
කොළඹ 10,ගෝතමී බාලිකා මහා විද්‍යාලයේ ආචාරිනී ඒ. ඩබ්ලිව්. එම්. අනුරා වීරසූරිය මහත්මිය
ගා/ඕපාත මහා විද්‍යාලයේ ආචාර්ය එස්. ආර්. සමරවික්‍රම මහතා

**ලේඛක මණ්ඩලය** :

කැලණිය විශ්වවිද්‍යාලයේ බෞද්ධ හා පාලි පශ්චාත් උපාධි ආයතනයේ
කථිකාචාර්ය, පූජ්‍ය මඩිහේ සුගතසිරි හිමි
ජාතික අධ්‍යාපන ආයතනයේ කථිකාචාර්ය, පූජ්‍ය උඩුගම සුදස්සී හිමි
ජාතික අධ්‍යාපන ආයතනයේ හිටපු කථිකාචාර්ය, එස්. පී. විතාන මයා
බප/ජය/ඉහළ බෝමිරිය කනිටු විදුහලේ විදුහල්පති උදයරුවන් මල්ලිකාරච්චි මහතා
පිළියන්දල අධ්‍යාපන කලාපයේ ගුරු උපදේශක එල්. එන්. ඒ. වීරසිංහ මහතා
රත්නපුර අධ්‍යාපන කලාපයේ ගුරු උපදේශක වයි. පී. පී. කවිසිගමුව මහත්මිය
කිරිල්ලවල මධ්‍ය විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති කේ. කේ. සාගරිකා වික්‍රමආරච්චි මහත්මිය

**විෂය සංස්කරණය** :

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හිටපු කථිකාචාර්ය
අතිපූජ්‍ය ගන්තුනේ අස්සජී මහානායක හිමිපාණෝ

**භාෂා සංස්කරණය** :

ඩබ්ලිව්. කරුණාරත්න මයා, කථිකාචාර්ය, ගුරු මධ්‍යස්ථානය, ගිරාගම, පිළිමතලාව.

**පරිගණක වදන් සැකසුම** :

මංගලිකා විජේරත්න මහත්මිය, කළමනාකරණ සහකාර 1, ජාතික අධ්‍යාපන ආයතනය

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

බෞද්ධාගමික ඉගැන්වීම්වලට අනුකූල ව සාර්ථක ජීවිතයක් පවත්වා ගැනීමට සුදුසු වන පරිදි, අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොට ගෙන, පාසල් අධ්‍යාපනය හරහා එකී නිපුණතා සංවර්ධනය කර ගැනීම උදෙසා මගපෙන්වීමට මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

දැනුමින් පමණක් පෝෂිත ව, දැනුම් කේන්ද්‍රීය විභාග ක්‍රමයක් යටතේ ඉහළ සාමර්ථ්‍යයක් ලැබුව ද එය ප්‍රමාණවත් නො වේ. සාර්ථක අධ්‍යාපන ක්‍රමයක දී හිස මෙන් ම හද හා අත ද පෝෂණය වීම අත්‍යවශ්‍ය වේ. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම ගුරු මාර්ගෝපදේශය සම්පාදනයේ දී අපේක්ෂා කර ඇත.

පාඩමට ප්‍රවේශය වඩාත් වැදගත් වන බැවින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබා දීම වැදගත් වේ. පාඩමේ සංවර්ධනයට අදාළ කරගත හැකි යෙදවුම්, ගුණාත්මක යෙදවුම් යන්නෙන් අදහස් කෙරේ.

- පාඩමට අදාළ ව සංයුක්ත තැටි, පරිගණකය, බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය (Multi Media)
- චිත්‍ර , ගීත, පුවත් පත්, සඟරා, ඇටවුම්, ප්‍රතිමා, මූර්ති, කැටයම්, ඡායාරූප
- පෙළ පොත, ලියන පුවරුව, කඩදාසි, විවිධ වර්ණ ඇතුළත් තීන්ත පෑන්, චලන රූප, කාන්දම් රඳවනය, පැනල් පුවරුව
- අදාළ කරගත හැකි වෙනත් සම්පත්

කණ්ඩායම් ක්‍රියාකාරකමක දී ශිෂ්‍ය කණ්ඩායමක සිටිය යුතු ප්‍රශස්ත සංඛ්‍යාව 07ක් ලෙස සැලකෙන බැවින් ඊට ගැළපෙන පරිදි සංවිධානය වීම වැදගත් ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඊට වඩාත් සුදුසු ස්ථානය තෝරා ගැනීමට ගුරුවරයා උනන්දු විය යුතු ය. (උදා. විහාරස්ථානය, පාසලේ බුදු මැදුර, රුක් සෙවණක් ආදි) පාඩමට (ක්‍රියාකාරකමට) පිවිසීමේ දී ප්‍රබෝධාත්මක ආරම්භය, පෙර අත්දැකීම් හා පාඩම පිළිබඳ කුතුහලය යන කරුණු ගැන සැලකිලිමත් වෙමින් ප්‍රදේශයේ සංස්කෘතික පසුබිම කෙරෙහි ද අවධානය යොමු විය යුතු ය. ශ්‍රද්ධාව ජනනය වන පරිදි ශාසනික වචන භාවිතය පිළිබඳ සැලකිලිමත් වන්න.

මෙහි ඇතුළත් පාඩම්වලට යෝජිත ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය භාවිත කිරීම අනිවාර්ය නොවන අතර විකල්ප ඉගෙනුම් ක්‍රම, සුදුසු පරිදි භාවිත කළ හැකි ය. එහෙත් නිපුණතාව හා නිපුණතා මට්ටමෙන් බැහැර නොවිය යුතු ය. ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යහපත් ආගමික ආකල්ප වර්ධනය කෙරෙහි ද ප්‍රායෝගික අවස්ථා යොදා ගැනීම කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කරන්න.

පාඩම ආරම්භයේ සිට අවසානය දක්වා තක්සේරුව සිදු කළ යුතු අතර හැකියා නොහැකියා අනුව ප්‍රතිපෝෂණය හා ඉදිරි පෝෂණය ලබා දිය යුතු ය. කණ්ඩායම් ගවේෂණ ක්‍රියාවලියෙන් අනාවරණය කර ගන්නා ඉගෙනුම් පල අභ්‍යාස පොත්වල කෙටියෙන් සටහන් කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න. බොහෝ විට කාල සටහන් සැකසීමේ දී කාලච්ඡේද දෙකක් එකවර නොලැබෙනු ඇත. එබැවින් අදාළ පාඩම කළමනාකරණය කර ගැනීම ඔබ සතු වගකීමකි. අදාළ පාඩමට අපේක්ෂිත ඇගයුම, තක්සේරුව හා ඇගයීම් නිර්ණායක අනුව සකස් කර ගන්න. ඔබ විසින් සිසුන්ට ලබා දෙන ලද අභ්‍යාසවල නිරවද්‍යතාව පරීක්ෂා කොට සටහන් තබන්න.

සෑම පාඩම් සටහනක් අවසානයේ ම යොදා ඇති ගෙදර පරිසරයෙන් යන කොටස දෙමාපිය වැඩිහිටි සහභාගිත්වය යටතේ සිදු කරන්නට යෝජිත ය. ඒ සඳහා අදාළ උපදෙස්, විදුහල්පති විසින් පාසල් සංවර්ධන සමිතියේ දී ද, විෂය භාර ගුරු භවතා විසින් පන්ති කවවල දී ද දෙමාපියන්ට හා වැඩිහිටියන්ට ලබා දීමට කටයුතු කළ යුතු ය.

**කථිකාචාර්ය**
**ශාස්ත්‍රපති පූජ්‍ය උඩුගම සුදස්සී හිමි**
**ව්‍යාපෘති නායක**

| පටුන | පිටුව |
|---|---|


| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | i |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | i |
| විෂයමාලා කමිටුව | iii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | iv |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | vii |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1-45 |
| විවිධ සහාය | 46 |

# විෂය නිර්දේශයේ අන්තර්ගතය

## විෂය හැඳින්වීම

බුදු දහමෙහි විෂය කරුණු ප්‍රායෝගිකත්වයට නැඹුරු කරවීම අන් කවර යුගයකටත් වඩා වර්තමානයේ අත්‍යවශ්‍ය ව පවතී. හුදු වනපොත්කරණයෙන් හා දහම් කරුණු හැදෑරීමෙන් ඔබ්බට ගොස් දෛනික ජීවිතයේ මුහුණ දීමට සිදු වන විවිධ ගැටලුවල දී ඒවාට සාර්ථක ව මුහුණ දීම සඳහා දහම් කරුණු භාවිතයට නැඹුරු කරවීම අතිශය වැදගත් වේ.

බුද්ධ ධර්මය විෂය සඳහා පාසල් කාලසටහනෙහි වෙන් වී ඇත්තේ සතියකට කාලච්ඡේද දෙකක් වුව ද එම කාලය වඩාත් අර්ථවත් ව හා ඵලදායී ව යොදා ගැනීම දහම් ගුරු භවතාගේ වගකීමකි. සමබර පෞරුෂයකින් හෙබි පුරවැසියකු බිහි කිරීම සඳහා බුද්ධ ධර්මය විෂය නිර්දේශයෙහි දැක්වෙන නිපුණතා අත්පත් කර ගැනීමට මහෝපකාරී වේ.

නව සහස්‍රකයේ පළමු විෂයමාලා ප්‍රතිසංස්කරණයෙහි අත්දැකීම් ද පාදක කොට ගනිමින් වඩාත් ගුණාත්මක පරිවර්තනයක් ඇති කිරීමටත් දෛනික ජීවිතයේ දී සැබෑ බෞද්ධයකු ලෙස දරුවාට කටයුතු කිරීමටත්, විචාරශීලි මනසකින් හෙබි දැහැමි පුද්ගලයකු බිහිකිරීමටත් විෂය නිර්දේශය මග පාදනු ඇතැයි අපේක්ෂා කෙරේ.

6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය තෙක් විෂය නිර්දේශය පොදු නිපුණතා 10කින් සමන්විත වන අතර, ඒ ඒ ශ්‍රේණියට ගැළපෙන නිපුණතා මට්ටම්වලින් ද එම නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට වඩාත් උචිත විෂය සන්ධාරයකින් ද සමන්විත ය. ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයේ දී නිපුණතා මට්ටම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කොට එම නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගත හැකි පරිදි විෂය සන්ධාරයට අදාළ කරුණු හරවත් ව පෙළ ගස්වා, සිසුන්ට ඉදිරිපත් කළ යුතු වේ. මෙම විෂය නිර්දේශයෙන් සැබවින් ම දරුවා සක්‍රීය ඉගෙනුමක් කරා ගෙන යාමටත් වඩාත් ප්‍රත්‍යක්ෂකරණයකට යොමු කිරීමෙන් දරුවන් තුළ දැහැමි බව වර්ධනය කිරීමටත් අපේක්ෂා කරනු ලැබේ. හැකි තරම් ප්‍රායෝගික අත්දැකීම්වලින් නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට සංවිධානය කිරීම ගුරුභවතුන් ඇතුළු විෂය භාර සියලු දෙනාගේ වගකීම වේ.

## ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

### ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතුය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.
2. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.
4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
7. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.
8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යොන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන් පත් කර ගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා**

   සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

   **සාක්ෂරතාව** — සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

   **සංඛ්‍යා පිළිබඳ දැනුම** — භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

   **රූපක භාවිතය** — රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

   **තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** — පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයන් තුළ දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

   - නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලි හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
   - ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
   - චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා**

   මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

   **සමාජ පරිසරය** ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

   **ජෛව පරිසරය** සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

   **භෞතික පරිසරය** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

4. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**
   ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම. යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

5. **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**
   පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

6. **ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**
   සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

7. **ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා**
   ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

## විෂයයේ අරමුණු

(1) ත්‍රිවිධ රත්නයේ ගුණ හැඳින, ශ්‍රද්ධාවෙන් කටයුතු කරන, නිවැරදි ව ප්‍රායෝගික වතාවත්වල යෙදෙන දැහැමි දරු පරපුරක් බිහිකිරීම.

(2) ජීවන ගමනේ දී මුහුණ දෙන අභියෝග ජය ගැනීමට සහ නිවැරදි ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීමට බුදු දහමෙහි මූලික ඉගැන්වීම් උපයෝග කර ගැනීම පිණිස දරු පරපුරට මග පෙන්වීම.

(3) සුපෞරුෂයක් ගොඩනගා ගැනීම උදෙසා බෝසත් චරිතය, බුද්ධ චරිතය හා සිව්වනක් පිරිසට අයත් ශ්‍රේෂ්ඨ චරිත ආදර්ශ කොට ගැනීම සඳහා මග පෙන්වීම.

(4) ශ්‍රී ලාංකික උරුමය දායාද කොට ගත් අභිමානවත්, වගකීමෙන් සහ වගවීමෙන් යුතු දරු පරපුරක් ගොඩනගා ගැනීම.

(5) සිය ජීවන දර්ශනය ගොඩනගා ගැනීමේ දී ධම්මපද දේශනා සහ බෞද්ධ උපදේශ කාව්‍යය පදනම් කරගත් ඉගැන්වීම් චරිතායනයට මග පෙන්වීම.

(6) මානසික ඒකාග්‍රතාවෙන් යුතු සුසමාහිත පෞරුෂයක් ගොඩනගා ගැනීම සඳහා භාවනාව ප්‍රගුණ කිරීමට යොමු කරවීම.

(7) බෞද්ධ ශිෂ්ටාචාරයෙහි සුවිශේෂ අංග අධ්‍යයනය කොට, සහජීවනයෙන් කටයුතු කරන සිය අනන්‍යතාව රැක ගත් දරු පරපුරක් ගොඩනගා ගැනීම.

## විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි. | 7.1.1බුදු සිරිතේ ආරම්භක වකවානුවේ ප්‍රධාන සිද්ධි සවිස්තර ව අධ්‍යයනයනය කර ආදර්ශවත් ව කටයුතු කරයි. | • බුද්ධත්වයේ සිට කිඹුල්වත්පුර ගමන තෙක් බුදු සිරිත | • බුද්ධත්වයේ සිට කිඹුල්වත් පුර ගමන දක්වා බුදු සිරිතේ ප්‍රධාන සිදුවීම් පෙළ ගස්වයි.<br>• කළණ මිතුරෙකු ලෙස තම ජීවිතය සකස් කර ගැනීමට බුදු සිරිත ආදර්ශ කර ගනියි.<br>• බුදු සිරිතේ ආදර්ශ ඇසුරින් තම ජීවිතය හා සසඳා බලයි.<br>• යහපත් අරමුණු ඉටු කර ගනිමින් පරාර්ථයෙහි යෙදෙයි.<br>• කළණ මිතුරෙකු සේ කටයුතු කරයි. | 02 |
| | 7.1.2 බුදුරජාණන් වහන්සේ අසරණයන්ට හා ගිලනුන්ට පිහිට වු ආකාරය අගයමින් පරාර්ථයෙහි යෙදෙයි. | • අසරණයන්ට පිහිට වීම,<br>• ගිලනුන්ට උපස්ථාන කිරීම | • බුදු සිරිත ඇසුරින් අසරණයන්ට පිහිට වීම හා ගිලනුන්ට උපස්ථාන කිරීමට නිදසුන් දක්වයි.<br>• අසරණ භාවය හා ගිලන්වීම පොදු ධර්මතාවයක් බව පිළිගනියි.<br>• අසරණයෙකුට හෝ ගිලනෙකුට පිහිට වූ අවස්ථාවක් සඳහා කතාවක් ගොඩනගයි.<br>• අසරණ අයට හා ගිලනුන්ට පිහිට වෙයි.<br>• පරාර්ථයෙහි යෙදේ. | 02 |
| | 7.1.3 "ඉතිපිසෝ"පාඨය ඇසුරෙන් බුද්ධ රත්නයේ ගුණ හැඳින ශ්‍රද්ධාවෙන් ක්‍රියා කරයි. | • "ඉතිපියෝ........"පාඨයේ ඇතුළත් බුදුගුණ (සරල හැඳින්වීමක්) | • ඉතිපිසෝ පාඨයේ ගුණාංග අනුපිළිවෙළින් පැහැදිලි කරයි.<br>• නව අරහාදී බුදුගුණ අගය කරයි.<br>• ඉතිපිසෝ පාඨය බුදු ගුණ වෙන් වෙන්ව උච්ඡාරණය වන සේ සජ්ඣායනය කරයි.<br>• අවස්ථානුරූපී ව බුදුසරණ පතමින් ආශිර්වාද කරයි.<br>• බුද්ධ රත්නය කෙරෙහි සැදැහැති ව කටයුතු කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 ජීවන රටාව හැඩ ගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි. | **7.2.1 බෞද්ධ සිරිත් විරිත් අර්ථවත් ව අනුගමනය කරයි.** | • බෞද්ධ සිරිත් විරිත් අර්ථවත් ව අනුගමනය කරයි. | • අනුගමනය කරන බෞද්ධ සිරිත් විරිත් නම් කරයි.<br>• අර්ථාන්විත ව කටයුතු කිරීම බෞද්ධ සිරිත් විරිත් අනුගමනයේ දී වැදගත් බැව් පෙන්වා දෙයි.<br>• පන්සල, පාසල හා නිවෙස් යන පරිසරවල දී අනුගමනය කළ හැකි බෞද්ධ සිරිත් විරිත් ගොනු කොට දක්වයි.<br>• බෞද්ධ සිරිත් විරිත් දෛනික ව අර්ථවත් ව අනුගමනය කරයි.<br>• දෛනික කටයුතුවල දී බෞද්ධ අනන්‍යතාව ප්‍රදර්ශනය කරයි. | 02 |
| | **7.2.2 භාවනාවේ ප්‍රායෝගික වටිනාකම හැඳින දෛනික ව භාවනාවේ යෙදෙයි.** | • මෛත්‍රී භාවනාව (කරණීය මෙත්ත සූත්‍රය ඇසුරින්) | • කරණීයමෙත්ත සූත්‍රයට අනුව මෛත්‍රී භාවනාව වඩන ආකාරය පැහැදලි කරයි.<br>• මෛත්‍රී භාවනාවෙන් ප්‍රයෝජන රැසක් සැලසෙන බව පිළිගනියි.<br>• මෛත්‍රී භාවනාවේ දී අනුගමනය කරන නිවැරදි ඉරියව් ප්‍රදර්ශනය කරයි.<br>• සුහදශීලී ව කටයුතු කරයි.<br>• අල්පේච්ඡතාවෙන් කටයුතු කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| | **7.2.3 ශ්‍රාවක ශ්‍රාවිකා චරිත ආදර්ශයට ගෙන තම ජීවිතය අර්ථවත් කර ගනියි.** | • විශාඛා මහෝපාසිකාව සහ අනේපිඬු සිටුතුමා | • විශාඛා මහෝපාසිකාව හා අනේපිඬුසිටුතුමා පිළිබඳ ව වැදගත් කරුණු පැහැදිලි කරයි.<br>• ශ්‍රාවක - ශ්‍රාවිකා චරිතවලින් තම දිවියට ආදර්ශ ලබා ගත හැකි බව පිළිගනියි.<br>• ඉහත චරිත දෙක ඇසුරින් උපදේශ පාඨ ගොඩනගයි.<br>• ආදර්ශවත් චරිත ඇතුළත් පොතපත කියවයි.<br>• චරිතවල ඇති යහගුණාංග ආදර්ශනය කර ගනියි. | 02 |
| | **7.2.4 ධම්මපද ගාථා ඇසුරින් තම ජීවන දර්ශනය හැඩගසා ගැනීමට ක්‍රියා කරයි.** | • "අක්කොච්ඡි මං අවධි මං " යන ගාථා දෙක සහ එහි අර්ථය | • අදාළ ධම්ම පද ගාථා දෙකෙහි සරල අරුත් පවසයි.<br>• කළ වරද පිළිබඳ ව වෛරී සහගත ව නොසිතන්නන්ගේ වෛරය සන්සිදෙන බව පිළිගනියි.<br>• අදාළ ධම්ම පද ගාථා දෙක නිවැරදි ව සජ්ඣායනා කරයි.<br>• අන්‍යයන් හා ගැටුම් අවම කර ගනියි.<br>• ඉවසීම ප්‍රගුණ කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි. | **7.3.1 සදාචාරවත් සමාජයක් සඳහා පංචසීල ප්‍රතිපත්තිය උපයෝගී වන බව පිළිගෙන ඒ අනුව ක්‍රියා කරයි.** | • පංචශීල ප්‍රතිපත්තියෙහි සාමාජික අගය | • සිල්පද පහ අරුත් සහිත ව පවසයි.<br>• පංචසීල ප්‍රතිපත්තියෙහි සාමාජික වටිනාකම පෙන්වා දෙයි.<br>• ''සදාචාරවත් සමාජයක් උදෙසා පංචසීලය සුරැකීම'' ගැන කතාවක් කරයි.<br>• සමාජ සම්මතයනට අනුකූල ව කටයුතු කරයි.<br>• යහපත් සමාජයක කොටස්කරුවෙක් වෙයි. | 02 |
| | **7.3.2 ආජීව අෂ්ටමක සීලය පාදකකොට ගෙන තම ආධ්‍යාත්මික සංවර්ධනය ඇති කර ගනියි.** | • ආජීව අෂ්ඨමක ශීලය හඳුන්වා එයින් ආධ්‍යාත්මික සංවර්ධනය ඇති කරන ආකාරය විස්තර කිරීම | • ආජීව අෂ්ටමක සීලය පංචසීල ප්‍රතිපත්තියෙන් වෙනස් වන ආකාරය ප්‍රකාශ කරයි.<br>• ආජීව අෂ්ටමක සීලය ආධ්‍යාත්මික සංවර්ධනයට වඩාත් හේතු කාරක වන බව පිළිගනියි.<br>• ආජීව අෂ්ටමක සීලය කාලානුරූපීව ප්‍රකාශ කර අදහස් දක්වයි.<br>• යහපත් සමාජ සම්මතයන්ට ගරු කරයි.<br>• නිවැරදි දිවි පැවැත්මකට හුරු වෙයි. | 02 |
| | **7.3.3 බෞද්ධ සමාජ ධර්මවලට අනුගත වෙමින් ගුරු සිසු සබඳතා ගොඩනගා ගනියි.** | • ගුරුවරුන්ගේ ගුණ හැඳින ගුරු ගෞරවය රැකෙන පරිදි කටයුතු කරන අයුරු විස්තර කිරීම (සිගාලෝවාද සූත්‍රය) | • සිගාලෝවාද සූත්‍රයේ ගුරු ශිෂ්‍ය යුතුකම් පැහැදිලි කරයි.<br>• ගුරු භවතුන්ගේ ගුණ හැඳින ගෞරවයෙන් කටයුතු කළ යුතු බැව් පෙන්වා දෙයි.<br>• '' ගුරු ගෞරවයෙන් යුතුව කටයුතු කිරීමේ වැදගත්කම යන මැයෙන් කතාවකට උචිත සැලසුම සකස් කරයි.<br>• තම යුතුකම් මැනවින් ඉටු කරයි.<br>• ගුරු ගෞරයෙන් යුතුව කතා කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| 4.0 සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනඟා ගැනීමට කටයුතු කරයි. | **7.4.1 නායකයකුගේ වගකීම හා වගවීම තේරුම් ගෙන ඒ අනුව තම පෞරුෂය ගොඩනගා ගනියි.** | • නායකත්ව ලක්ෂණ (අපණ්ණක ජාතකය) | • නායකයකුගේ වගකීම හා වගවීම පැහැදිලි කරයි.<br>• තම පෞරුෂය ගොඩනගා ගැනීමට වගකීම හා වගවීම හේතු වන පිළිගනියි.<br>• නායකත්ව ලක්ෂණ ලැයිස්තු ගත කරයි.<br>• නායකත්වයට ගරු කරයි.<br>• නායකයකු ලෙස කටයුතු කරයි. | 02 |
| | **7.4.2 ඉවසීමෙන් යුතුව ලෝක ස්වභාවයට මුහුණ දෙයි.** | • ඉවසීම (ඉවසන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග, ඉවසීම ප්‍රගුණ කළ යුතු අවස්ථා, නොඉවසීමෙන් ලැබෙන අයහපත් ප්‍රතිඵල, ඉවසීමෙන් ලැබෙන යහපත් ප්‍රතිඵල) | • ඉවසීමේ ගුණාංග පැහැදිලි කරයි.<br>• අවස්ථානුකූල ව ඉවසීම ප්‍රගුණ කළ යුතු බව පෙන්වා දෙයි.<br>• ඉවසීමේ ආනිශංස හා නොඉවසීමේ ආදීනව ලැයිස්තු ගත කරයි.<br>• අන් මත පිළිබඳ ව සැලකිලමත් වෙයි.<br>• ඉවසීමෙන් කටයුතු කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි. | **7.5.1 බුදු දහම ඇසුරින් පෝෂණය වූ ශ්‍රී ලාංකික සමාජධර්ම රැක ගැනීමට ක්‍රියා කරයි** | • බුදු දහම ඇසුරින් පෝෂණය වූ ශ්‍රී ලාංකික ජන සංස්කෘතියේ සුවිශේෂී ලක්ෂණ යටතේ කළගුණ සැලකීම, ආගන්තුක සත්කාරය, වැඩිහිටියන්ට සැලකීම, අග්‍රශ්‍රෂ්‍ය දානය, භික්ෂු නායකත්වය පිළිගැනීම. | • බුදු දහමින් පෝෂණය වූ ශ්‍රී ලාංකික ජන සමාජයේ සුවිශේෂී ලක්ෂණ නම් කරයි.<br>• බුදු දහමින් පෝෂිතව සංස්කෘතික ලක්ෂණ ජාතික ප්‍රෞඪත්වයට හේතු වන බව පිළිගනියි.<br>• ශ්‍රී ලාංකික ජන සමාජයේ සුවිශේෂී ලක්ෂණ කීපයක් නිරූපණය කරයි.<br>• පාසල් සංස්කෘතියේ සුවිශේෂී ලක්ෂණයන්ට අනුගතව ක්‍රියා කරයි.<br>• ජන සංස්කෘතියේ සුවිශේෂී ලක්ෂණයන්ට ගරු කරමින් සුරක්ෂිත කරයි. | 02 |
| | **7.5.2 බෞද්ධ ඉගැන්වීම් ශ්‍රී ලාංකික ජන සමාජයේ පදනම බව දැන සහයෝගිත්වයෙන් කටයුතු කරයි.** | • ශ්‍රී ලාංකීය ජන සමාජයේ සහජීවනයට පදනම් වූ බෞද්ධ ඉගැන්වීම් (සහජීවන සංකල්පය, අවිහිංසාව, සමානාත්මතාව අන්‍ය මත ඉවසීම) | • ශ්‍රී ලාංකික ජන සමාජය සහජීවනයට පදනම් වූ බෞද්ධ ඉගැන්වීම් පැහැදිලි කරයි.<br>• බුදු දහමෙහි ඉගැන්වෙන සහජීවනයෙන් යහපත් ශ්‍රී ලාංකික ජන සමාජයක් ගොඩනැගුන බව පිළිගනියි.<br>• ''සහජීවනයට අදාළ වන බෞද්ධ ඉගැන්වීම් යහපත් සමාජයක් සඳහා උපකාරවත් වෙයි'' යන මැයෙන් කතාවක් පවත්වයි.<br>• අන් සිසුන් සමග සහයෝගයෙන් කටයුතු කරයි.<br>• සහජීවනයෙන් කටයුතු කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි. | **7.6.1 ජීවිතය හා සම්බන්ධ සියල්ලම සිදු වන්නේ පූර්ව කර්මයෙන් නො වන බව පිළිගෙන කටයුතු කරයි.** | • නියාම ධර්ම | • නියාම ධර්ම පැහැදිලි කරයි.<br>• ජීවිතය හා සම්බන්ධ සියල්ලම පූර්ව කර්මයෙන් සිදු නො වන බව පිළිගනියි.<br>• නියාම ධර්මයන් සඳහා කාලීන නිදසුන් දත්ත ලේඛනයක් සකස් කරයි.<br>• කර්ම වාදයෙන් මිදී අධ්‍යාපනයේ යෙදේ<br>• සියල්ල පෙර කර්මයෙන් සිදු නො වන බව දැන කටයුතු කරයි. | 02 |
| | **7.6.2 චතුරාර්ය සත්‍ය හැඳින ධර්මය කෙරෙහි පැහැදීමෙන් කටයුතු කරයි.** | • චතුරාර්ය සත්‍ය පිළිබඳ මූලික හැඳින්වීම | • චතුරාර්ය සත්‍ය නිවැරදි ව නම් කරයි.<br>• දුක පිළිබඳ ගැටලුව විසඳා ගැනීමට චතුරාර්ය සත්‍යය මග පෙන්වන බව පිළිගනියි.<br>• චතුරාර්ය සත්‍ය ගැලීම් සටහනකින් නිරූපණය කොට දක්වයි.<br>• ගැටලු හඳුනා ගෙන ඒවා විසඳා ගැනීමට කටයුතු කරයි.<br>• ගැටලු නිවැරදි ආකාරයට විසඳා ගනියි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 ජීවි අජීවී පරිසරයට හිතකාමී ව හැසිරෙයි. | **7.7.1 තමා උපමාවට ගනිමින් ජීව හිතවාදී ආකල්ප ගොඩ නඟා ගනී.** | • අත්තූපනායික ධර්ම පර්යාය (වේළුද්වාර සූත්‍රයේ නිදාන කථාව ඇසුරින්) අධිපති ධර්ම | • වේළුද්වාර සූත්‍රයේ දැක්වෙන අත්තූපනායික ධර්මය පැහැදිලි කරයි.<br>• තමා උපමා කොට කටයුතු කළ යුතු බව පිළිගනියි.<br>• අධිපති ධර්ම පැහැදිලි කරමින් බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කරයි.<br>• අන්‍යයන් ද තමා මෙන් සලකා කටයුතු කරයි.<br>• පරහිතකාමී වෙයි. | 02 |
| | **7.7.2 මානව සබඳතා පවත්වා ගැනීමට ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුතු ව ක්‍රියා කරයි.** | • කතා බහ සහ හැසිරීම, පාසල් පිරියත, පන්සල, නිවස | • යහපත් මානව සබඳතා පවත්වා ගන්නේ කෙසේ දැයි පැහැදිලි කරයි.<br>• මානව සබඳතා පවත්වා ගැනීමේ දී අවස්ථාවෝචිත ව ක්‍රියා කිරීමේ වැදගත්කම පිළිගනියි.<br>• අන් අයගේ සිත් දිනා ගත හැකි, විවිධ ස්ථානවලට යෝග්‍ය, දෙබස් කීපයක් නිර්මාණය කරයි.<br>• දෛනික චර්යාවෙහි ප්‍රියශීලීව හැසිරෙයි.<br>• මනා අන්‍යෝන්‍ය සබඳතා ගොඩනගා ගනියි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි. | 7.8.1 **මහින්දාගමනයෙන් ශ්‍රී ලාංකිකයන් ලද දායාද හැඳින ඒවා ශාසනික හා සංස්කෘතික වශයෙන් ඇගයීමට ලක් කරමින් සංරක්ෂණය කරයි.** | • මහින්දාගමනයේ ශ්‍රී ලාංකික දායාද පිළිබඳ සරල හැඳින්වීම (බුදු දහම, බෞද්ධ සිද්ධස්ථානයක අංග, භික්ෂු, භික්ෂුණී පැවිද්ද, කලාශිල්ප, සාහිත්‍යය) | • මහින්දාගමනයෙන් ලත් දායාද මොනවා දැයි පැහැදිලි කරයි.<br>• ශ්‍රී ලාංකිකයන්ට උරුම වූ එම දායාද සංරක්ෂණය කළ යුතු බව පිළිගනියි.<br>• මහින්දාගමනයෙන් ලත් දායාද ඇසුරින් ප්‍රදර්ශනයක් කරයි.<br>• ශාසනික හැඟීමෙන් යුක්ත ව කටයුතු කරයි.<br>• ශාසනික හා සංස්කෘතික දායාද ආරක්ෂා කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0 බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි. | **7.9.1 ධන පරිහරණයට අදාළ බෞද්ධ ඉගැන්වීම් අනුගමනය කරයි.** | • පරිහරණය හා නඩත්තුව සමජීවිකතාව, අබලි දේ අලුත් වැඩියාව, පූජාවක් වශයෙන් ලැබෙන චීවරයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගන්නා අයුරු, පොදු දේපළ පරිහරණය (සාංඝික දේපළ පරිහරණ රටාව) | • සම්පත් කළමනාකරණයේ ඇති වැදගත්කම පැහැදිලි කරයි.<br>• සම්පත් කළමනාකරණයෙන් යහපත් ආර්ථික පසුබිමක් ඇති කර ගත හැකි බැව් පිළිගනියි.<br>• ''සීමිත සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමේ වැදගත්කම'' පිළිබඳ ව කතාවක් කරයි.<br>• පාසලේ දේපළ සුරකියි.<br>• සාංඝික දේපළ පිළිබඳ නිවැරදි ආකල්පයෙන් යුතු ව කටයුතු කරයි. | 02 |
| 10.0 නිර්වාණය අරමුණු කොට ගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි. | **7.10.1 නිවැරදි දැක්මකින් හා මනා හැඟීමකින් යුතු ව පුණ්‍ය ක්‍රියාවන් හි යෙදෙයි.** | • පුණ්‍ය ක්‍රියා (කාව්‍යශේඛරය) | • කාව්‍යශේඛරයට අනුව පුණ්‍ය ක්‍රියා දොළසක් ඇති බව ප්‍රකාශ කරයි.<br>• පින්කම්හි අගය දැන එහි නියැළෙන්නට පෙලඹෙයි.<br>• තුන් පුණ්‍ය ක්‍රියා, දස පුණ්‍ය ක්‍රියා සහ දොළොස් පුණ්‍ය ක්‍රියා වෙන වෙනම ලැයිස්තු ගත කරයි.<br>• පාසල තුළ දී ආගමික කටයුතු සංවිධානය කරයි.<br>• ආදර්ශවත් පුණ්‍යකාමී දිවියක් ගත කරයි. | 02 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**නිපුණතාව 01** : තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම 7.1.1** : බුදු සිරිතේ ආරම්භක වකවානුවේ ප්‍රධාන සිද්ධි සවිස්තර ව අධ්‍යයනය කර ආදර්ශවත් ව කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- බුද්ධත්වයේ සිට කිඹුල්වත් පුර ගමන දක්වා බුදු සිරිතේ ප්‍රධාන සිදුවීම් පෙළ ගස්වයි.
- කළණ මිතුරෙකු ලෙස තම ජීවිතය සකස් කර ගැනීමට බුදු සිරිත ආදර්ශ කර ගනියි.
- බුදු සිරිතේ ආදර්ශ ඇසුරින් තම ජීවිතය හා සසඳා බලයි.
- යහපත් අරමුණු ඉටු කර ගනිමින් පරාර්ථයෙහි යෙදෙයි.
- කලණ මිතුරෙකු සේ කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

බුද්ධත්වයේ සිට කිඹුල්වත්පුර ගමන තෙක් සවිස්තරාත්මක අධ්‍යයනයක් මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- බුදුරජාණන් වහන්සේගේ කිඹුල්වත්පුර චාරිකාව දෙනුවර සිට නිවේදකයන් දෙදෙනෙකු විසින් කෙරෙන සජීවී විස්තර ප්‍රචාරයක් දරුවන් දෙදෙනෙකු ලවා කරවන්න.
- විස්තර ප්‍රචාරය ඇසුරින් කිඹුල්වත්පුර චාරිකාව පිළිබඳ කරුණු විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.

  බුද්ධත්වයේ සිට කිඹුල්වත්පුර චරිකාව තෙක් මෙවැනි වැදගත් කරුණු රැසක් ඇති බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බුද්ධත්වයේ සිට කිඹුල්වත්පුර චාරිකාව තෙක් වැදගත් කරුණු රැසක් ඇති බව
    - සත්සතිය
    - ප්‍රථම ධර්ම දේශනය
    - යස කුල පුතුගේ පැවිදි වීම
    - ප්‍රථම රහත් සැට නම හා ප්‍රථම ධර්ම දූත සේවාව
    - භද්දවග්ගිය කුමාරවරුන් පැවිදි වීම. (දෙවන රහත් තිස් නම)

- තුන් බෑ ජටිල දමනය
- බිම්බිසාර රජු හමුවීම
- අගසව් තනතුරු ප්‍රදානය
- සුද්ධෝදන රජුගේ ආරාධනාව
- කාළුදායි ඇමතිගේ පැවිදිවීම
- කිඹුල්වත්පුර  චාරිකාවට ආරාධනය
- කිඹුල්වත්පුර චාරිකාව
- ඉහත සිදුවීම් ඇසුරන් ජීවිතාදර්ශ රැසක් ලබා ගත හැකි බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය  වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු  ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1 : බුද්ධත්වයේ  සිට කිඹුල්වත් පුර චාරිකාව තෙක් වැදගත් සිදුවීම් පෙළගස්වන්න.
කණ්ඩායම 2 : බුද්ධත්වයේ සිට කිඹුල්වත් පුර චාරිකාව තෙක්, වැදගත් සිදුවීම් ඇසුරෙන් කල්‍යාණ මිත්‍රත්වය පිළිඹිබු වන අවස්ථා පැහැදිලි කරන්න.
කණ්ඩායම 3 : බුද්ධත්වයේ සිට කිඹුල්වත් පුර චාරිකාව තෙක් වැදගත් සිදුවීම් ඇසුරෙන් ගත හැකි ජීවිතාදර්ශ ලියන්න.

**ගෙදර පරිසරයෙන්** :
දෙමාපියන්, තමන් අන්‍යයන්ගේ සුභ සිද්ධියට ද හේතු වන අයුරින් කටයුතු කළ අවස්ථා පෙන්වා දෙමින් දරුවන් ද ඊට යොමු කරන්න.

**නිපුණතාව 01** : තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම 7.1.2** : බුදුරජාණන් වහන්සේ අසරණයන්ට හා ගිලනුන්ට පිහිට වූ ආකාරය අගයමින් පරාර්ථයෙහි යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- බුදු සිරිත ඇසුරින් අසරණයන්ට පිහිට වීම හා ගිලනුන්ට උප්සථාන කිරීම පිළිබඳ නිදසුන් දක්වයි.
- අසරණ භාවය හා ගිලන්වීම පොදු ධර්මතාවයක් බව පිළිගනියි.
- අසරණයෙකුට හෝ ගිලනෙකුට පිහිට වූ අවස්ථාවක පැවැත්වීමට සුදුසු කතාවකට සැකිල්ලක් ගොඩනගයි.
- අසරණ අයට හා ගිලනුන්ට පිහිට වෙයි.
- පරාර්ථයෙහි යෙදේ.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

බුදු සිරිත ඇසුරින් අසරණයන්ට පිහිටවීම හා ගිලනුන්ට උපස්ථාන කිරීම පිළිබඳ හැදෑරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- බුදුරජාණන් වහන්සේ ගිලනුන්ට උපස්ථාන කළ හා අසරණයන්ට පිහිට වූ අවස්ථා දැක්වෙන පින්තූර කිහිපයක් පෙන්වමින් සිසුන්ගෙන් කරුණු විමසන්න.
- මෙම කතා පුවත්වලින් බුදුජාණන් වහන්සේගේ ගිලානෝපස්ථාන හා අසරණ සරණ ගුණය පැහැදිලි කරන්න.
- මෙම ධර්මතාව වර්තමාන සමාජයේ ද ප්‍රකට ව පවතින බව පැහැදිලි කරන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න..

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බුදුරජාණන් වහන්සේගේ ප්‍රායෝගික ජීවිතයෙන් අසරණ සරණ වීම හා ගිලානෝපස්ථානය ප්‍රකට වන බව
  - ඕනෑම තරාතිරමක අයෙකු අසරණයෙකු හෝ ගිලනකු විය හැකි බව
  - මේ සම්බන්ධයෙන් වත්මන් සමාජයෙන් නිදසුන් රැසක් පෙන්වා දිය හැකි බව
  - අසරණ සරණ ගුණය හා ගිලානෝපස්ථානය පරාර්ථ චර්යාවක් බව
  - පරාර්ථයේ යෙදීම උතුම් මානුෂික ගුණාංගයක් බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

(1) බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයේ අසරණයින්ට පිහිට වූ අවස්ථා හා ගිලනුන්ට පිහිට වූ අවස්ථා නිදර්ශන සහිත ව පැහැදිලි කරන්න.

(2) වර්තමාන සමාජයේ අසරණ බවට හා ගිලන් බවට පත් විය හැකි අවස්ථා කිහිපයක් නම් කොට ඔබට පිහිට විය හැකි ආකාරය පැහැදිලි කරන්න.

(3) පහත දැක්වෙන අවස්ථා දෙක පිළිබඳ ව අදහස් දක්වන්න.

1. ඔබ අසරණ තත්ත්වයට පත් වූ අවස්ථාවක හෝ ගිලන් තත්ත්වයට පත් වූ අවස්ථාවක ඇති වූ හැඟීම්
2. ඔබ අසරණයෙකුට හෝ ගිලනෙකුට පිහිට වන ආකාරය

**ගෙදර පරිසරයෙන් :**

ගිලනුන්ට හා අසරණයන්ට පිහිට විය හැකි අවස්ථා දරුවන්ට පෙන්වා දී ඒ සඳහා ඔවුන් යොමු කර ඇගයීමට ලක් කරන්න.

**නිපුණතාව 01 :** තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම 7.1.3 :** ''ඉතිපි සෝ ...........'' පාඨය ඇසුරින් බුද්ධ රත්නයේ ගුණ හැඳින ශ්‍රද්ධාවෙන් ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි.

**ඉගෙනුම් පල :**

- ''ඉතිපි සෝ ...........'' පාඨයේ ගුණාංග අනුපිළිවෙළින් පැහැදිලි කරයි.
- නව අරහාදී බුදුගුණ අගය කරයි.
- ''ඉතිපි සෝ ...........'' පාඨය බුදු ගුණ වෙන් වෙන් ව උච්චාරණය වන සේ සජ්ඣායනය කරයි.
- අවස්ථානුරූපී ව බුදුසරණ පතමින් ආශිර්වාද කරයි.
- බුද්ධ රත්නය කෙරෙහි සැදැහැති ව කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

''ඉතිපි සෝ ...........'' පාඨයේ ඇතුළත් බුදුගුණ, සිසුන්ට ශ්‍රද්ධාව ජනනය වන පරිදි ඉදිරිපත් කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

''රහසත් පව් නොකොට
කෙලෙසරයනුත් දුරුකොට
නිසි වූයෙන් පුදට
අරහ යැයි නම කියති මුනිඳුට ''

බුදුගුණ අලංකරණයේ සඳහන් මෙම කවිය ඇතුළත් පුවරුව සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.

- මෙම කවිය තාලානුරූපීව ගායනා කරන්න.
- මෙහි අදහස සිසුන් සමග සාකච්ඡා කරන්න.
- '' අරහං'' බුදු ගුණය මෙම කවියේ අන්තර්ගත බව පවසන්න.

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- ''ඉතිපි සො .......................'' පාඨයෙහි බුදු ගුණ නවයක් ඇති බව
- එක් එක් බුදු ගුණය සුවිශේෂී ව අර්ථකථනය කළ හැකි බව
- ''ඉතිපි සො............. පාඨය'' නිවැරදිව හා ශ්‍රද්ධාව ජනනය වන අයුරින් සජ්ඣායනය කළ යුතු බව
- ඉතිපි සෝ පාඨයෙහි සඳහන් බුදු ගුණ, බුදු ගුණ භාවනාවට ඉවහල් වන බව
- විපතක දී බුදු ගුණ මෙනෙහි කිරීමෙන් බිය දුරු වන බව
- බුදු ගුණ චරිත සංවර්ධනයට ඉවහල් කර ගත යුතු බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. නව අරහාදී බුදුගුණ අනුපිළිවෙළින් ලියා අර්ථය පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. ''ඉතිපි සෝ.......................'' පාඨයේ දැක්වෙන බුදු ගුණ ඉස්මතු වනසේ ශ්‍රද්ධාවෙන් නිවැරදි ව සජ්ඣායනය කරන්න.

කණ්ඩායම 3. බුද්ධ රත්නයේ ගුණ චරිත සංවර්ධනයට යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

දරුවන් සමග දෛනිකව බුද්ධ වන්දනාවෙහි යෙදීමෙන් අනතුරු ව බුදු ගුණ භාවනාව වඩන්න.

**නිපුණතාව 02 :** ජීවන රටාව හැඩ ගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනී.

**නිපුණතා මට්ටම 7.2.1 :** බෞද්ධ සිරිත් විරිත් අර්ථවත් ව අනුගමනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි.

**ඉගෙනුම් පල :**

- අනුගමනය කරන බෞද්ධ සිරිත් විරිත් නම් කරයි.
- බෞද්ධ සිරිත් විරිත් අනුගමනයේ දී අර්ථාන්විත ව කටයුතු කිරීමේ වැදගත්කම පෙන්වා දෙයි.
- පන්සල, පාසල හා නිවස යන පරිසරවල දී අනුගමනය කළ හැකි බෞද්ධ සිරිත් විරිත් ගොනු කොට දක්වයි.
- බෞද්ධ සිරිත් විරිත් දෛනික ව අර්ථවත් ව අනුගමනය කරයි.
- දෛනික කටයුතුවල දී බෞද්ධ අනන්‍යතාව ප්‍රදර්ශනය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

බෞද්ධ සිරිත් විරිත් අර්ථාන්විත ව අනුගමනය කිරීම පිළිබඳ ව හැඳින්වීමක් මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- සිරිත් මල්දම පොත පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- පොත පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- එහි අදාළ කවියක් සිසුන් සමඟ ගායනා කරන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - අදාළ කෘතියෙහි සිරිත් සහ විරිත් අන්තර්ගත බව පවසන්න.
  - කළ යුතු දේ කිරීමත්, නොකළ යුතු දෙයින් වැළකීමත් පිළිවෙළින් සිරිත් විරිත් ලෙස අදහස් කරන බැව් පැහැදිලි කරන්න.

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - ස්ථානය, අවස්ථාව හා පුද්ගල ස්වභාවය අනුව සිරිත් සුවිශේෂී වන බව.
  - නිවස, පාසල හා පන්සලේ දී අනුගමනය කළ හැකි සුවිශේෂී සිරිත් විරිත් රැසක් ඇති බව

- ආහාර අනුභවය, ඇඳුම් පැළඳුම් භාවිතය වැසිකිළි කැසිකිළි පරිහරණයට අදාළ සිරිත් - විරිත් කෙරෙහි වැඩි අවධානයක් දැක්විය යුතු බව
- ඕනෑම සිරිතක් අර්ථාන්විත ව අනුගමනය කළ යුතු බව.
- නිවැරදි සිරිත් විරිත් අනුගමනය කිරීමෙන් තම අනන්‍යතාව රැක ගත හැකි බව.

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

පහත සඳහන් ස්ථානවල දී අනුගමනය කළ යුතු සිරිත් විරිත් ලේඛනයක් පන්තියට ඉදිරිපත් කරමින් විස්තර කරන්න.

කණ්ඩායම 1. - නිවස
කණ්ඩායම 2. - පාසල
කණ්ඩායම 3. - පන්සල

**ගෙදර පරිසරයෙන් :**

නිවසේ දී අනුගමනය කළ යුතු සිරිත් විරිත් දෙමාපියන් දරුවන් හා සාකච්ඡා කොට දෛනික ජීවිතයට එක් කර ගනිමින් ඒ අනුව කටයුතු කිරීමට උත්සාහ කරන්න.

**නිපුණතාව 02** : ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම 7.2.2** : භාවනාවේ ප්‍රායෝගික වටිනාකම හැඳින දෛනික ව භාවනාවේ යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- කරණීයමෙත්ත සූත්‍රයට අනුව මෛත්‍රී භාවනාව වඩන ආකාරය පැහැදිලි කරයි.
- මෛත්‍රී භාවනාවෙන් ප්‍රයෝජන රැසක් සැලසෙන බව පිළිගනියි.
- මෛත්‍රී භාවනාවේ දී අනුගමනය කරන නිවැරදි ඉරියව් ප්‍රදර්ශනය කරයි.
- සුහදශීලී ව කටයුතු කරයි.
- අල්පේච්ඡතාවෙන් යුතුව කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

භාවනාවේ ප්‍රායෝගික වටිනාකම හැඳින දෛනික ව මෛත්‍රී භාවනාව වැඩීමට සිසුන් යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- කරණීය මෙත්ත සූත්‍රයේ ඇතුළත් ''මාතා යථා නියං පුත්තං .................. '' ගාථාව සිසුන්ට ඉදිරිපත් කරන්න.
- තම එකම පුතුට ආදරය දක්වන මවක සේ සියලු සත්වයින්ට ආදරය කරුණාව දැක්විය යුතු බව පැහැදිලි කරන්න.
- කරණීය මෙත්ත සූත්‍රය බුදුරජාණන් වහන්සේ භාවනානුයෝගී භික්ෂු පිරිසකට දේශන කළ බව පෙන්වා දෙන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - කරණීය මෙත්ත සූත්‍රයට අනුව භාවනා වඩන්නෙකු තුළ ගුණාංග 15ක් පැවතිය යුතු බව.
  - භාවනාව වැඩීමෙන් චිත්ත ඒකාග්‍රතාව ඇති වන බව
  - මෙම භාවනාව සමථ භාවනා වර්ගයට අයත් බව

- කරණීය මෙත්ත සූත්‍රයට අනුව භාවනා වඩන විශේෂ ආකාරයක් ඇති බව
- මෙම භාවනාව වැඩීමෙන් ආනිශංස රැසක් සැලසෙන බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. කරණීය මෙත්ත සූත්‍රයට අනුව මෛත්‍රී භාවනා වඩන්නෙකු තුළ ඇති කරගත යුතු ගුණාංග පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. කරණීය මෙත්ත සූත්‍රයට අනුව මෛත්‍රී භාවනාව වඩන ආකාරය ලියන්න.

කණ්ඩායම 3. කරණීය මෙත්ත සූත්‍රයට අනුව මෛත්‍රී භාවනාවෙන් ලැබෙන ආනිශංස දක්වන්න.

පන්තියම එක් කණ්ඩායමක් වී කරණීය මෙත්ත සූත්‍රයට අනුව මෛත්‍රී භාවනාවේ යෙදෙන්න.

(අහං අවෙරෝ හෝමි - මම වෛර නැත්තෙක් වෙම්වා ! ආදී වශයෙනි.)

**ගෙදර පරිසරයෙන් :**

දිනපතා බුද්ධ වන්දනයේ දී මෛත්‍රී භාවනාවෙහි යෙදෙමින් දරුවා ද ඊට යොමු කරන්න.

**නිපුණතාව 02** : ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම 7.2.3** : ශ්‍රාවක - ශ්‍රාවිකා චරිත ආදර්ශයට ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- විශාඛා මහෝපාසිකාව හා අනේපිඬුසිටුතුමා පිළිබඳ ව වැදගත් කරුණු පැහැදිලි කරයි.
- ශ්‍රාවක - ශ්‍රාවිකා චරිතවලින් තම දිවියට ආදර්ශ ලබා ගත හැකි බව පිළිගනියි.
- ඉහත චරිත දෙක ඇසුරින් උපදේශ පාඨ ගොඩනගයි.
- ආදර්ශවත් චරිත ඇතුළත් පොතපත කියවයි.
- චරිතවල ඇති යහගුණාංග ආදර්ශනය ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

විශාඛා මහෝපාසිකාව සහ අනේපිඬුසිටුතුමාගේ චරිත ඇසුරින් ආදර්ශ ගෙන ජීවිතය සාර්ථක කර ගැනීමට සිසුන්ට මග පෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- බුදුරජාණන් වහන්සේ වැඩිම වාරයක් වස් වසන ලද විහාරයේ නම විමසමින් ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- ජේතවනාරාමය - අනේපිඬුසිටුතුමා විසින් ඉදිකළ බව පැහැදිලි කරන්න.
- විශාඛා මහෝපාසිකාව ඉදි කොට පූජා කළ පූර්වාරාමයේ ද බුදුරජාණන් වහන්සේ බොහෝ වාර ගණනක් වස් විසූ බව පැහැදිලි කරන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - විශාඛා මහෝපාසිකාව
    - විශාඛා සිටු දියණිය කුඩා කල පටන් ඉතා ගුණ ගරුක ජීවිතයක් ගත කළ බව.
    - දෙමාපියන්ට කීකරුවීම
    - කුඩා කල පටන් බුදුරදුන් දැකීම ප්‍රිය කිරීම
    - සතුන්ට පවා කරුණාවෙන් සැලකීම
    - තම විවාහයේ දී පියාගෙන් අවවාද දහයක් ලැබීම
    - විවාහය නිසාවත් බෞද්ධකම වෙනස් නොකිරීම

    - මෙල පළඳනාව මිල කොට පූර්වාරාමය ඉදිකිරීම
    - අවස්ථාවෝචිත ව කටයුතු කිරීම
    - ස්වාමි පාර්ශ්වයේ ඥාතීන් බුදුදහමට නැඹුරු කිරීම
    - බුදුසසුන වෙනුවෙන් විශාල මෙහෙයක් ඉටු කිරීම
    - බුදුසසුනේ අග්‍ර දායිකාව බවට පත් වීම
- අනේපිඬු සිටුතුමා
    - සුදත්ත සිටුතුමා අසරණ සරණ ගුණය නිසා අනේපිඬු සිටුතුමා යන නමින් හැඳින්වීම
    - බුදුරජාණන් වහන්සේට ජේතවනාරාමය ඉදි කොට පූජා කිරීම
    - අචල ශ්‍රද්ධාවෙන් යුතුව කටයුතු කිරීම
    - මිතුරන් අතර කලණ මිතුරෙකු වීම
    - දරුවන්ට යහමග පෙන්වූ ගුණවත් පියෙකු වීම
    - උපායශීලී ව පුද්ගලයන් යහමග යැවීම
    - නිර්ලෝභීව නොසැලී කටයුතු කිරීම
    - බුදුසසුනේ අග්‍ර දායක තනතුරට පත් වීම

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. :

| **විශාඛා මහ උපාසිකාව** |
|---|
| *මූලික තොරතුරු*<br>*බුදු සසුනට ඇති සම්බන්ධය*<br>*වැදගත් සිදුවීම්*<br>*ලැබූ තනතුරු*<br>*ගත හැකි ආදර්ශ* |

කණ්ඩායම 2.

| අනේපිඬු **සිටුතුමා** |
|---|
| *මූලික තොරතුරු*<br>*බුදු සසුනට ඇති සම්බන්ධය*<br>*වැදගත් සිදුවීම්*<br>*ලැබූ තනතුරු*<br>*ගත හැකි ආදර්ශ* |

**ගෙදර පරිසරයෙන් :**
ඔබ ප්‍රදේශයේ ජීවත් වන යහපත් පුද්ගලයින් ඇසුරට දරුවා යොමු කරන්න.

**නිපුණතාව 02 :** ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම 7.2.4 :** ධම්මපද ගාථා ඇසුරින් තම ජීවන දර්ශනය හැඩගසා ගැනීමට ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** **02යි.**

**ඉගෙනුම් පල :**

- අදාළ ධම්ම පද ගාථා දෙකෙහි සරල අරුත් පවසයි.
- කළ වරද පිළිබඳ ව වෛරී සහගත ව නොසිතන්නන්ගේ වෛරය සන්සිඳෙන බව පිළිගනියි.
- අදාළ ධම්ම පද ගාථා දෙක නිවැරදි ව සජ්ඣායනා කරයි.
- අන්‍යයන් හා ගැටුම් අවම කර ගනියි.
- ඉවසීම ප්‍රගුණ කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

"අක්කොච්ඡි මං අවධි මං .................." යන ධම්ම පද ගාථා යුගලයෙන් යහපත් ජීවන දැක්මක් ඇති කර ගැනීමට සිසුන් පෙලඹවීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- "අක්කොච්ඡි මං අවධි මං .................." යන ධම්ම පද ගාථා දෙක ලියවුණ පුවරුව දරුවන්ට ප්‍රදර්ශනය කරන්න.
- එම ගාථාව සිසුන් සමග නිවැරදිව සජ්ඣායනය කරන්න.
- සරල අදහස සිසුන් සමග සාකච්ඡා කරන්න.

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

  ධම්ම පදය පිළිබඳ ව පහත තොරතුරු දැන ගත යුතු බව

  - බෞද්ධයාගේ අත්පොත බඳුය.
  - ගාථා 423කි.
  - වග්ග 26කි.
  - අදාළ ගාථා දෙක යමක වග්ගයට අයත් වේ.
  - ථුල්ල තිස්ස නම් හිමිනමක් අරහයා මෙම ගාථා යුගලය දේශනා කර ඇත.

- තමාට සිදු කළ අවැඩ නැවත නැවත මෙනෙහි කරන්නාගේ වෛරය නොසන්සිඳෙන බව
- මෙම ගාථා දෙකෙහි අරුත් තම ජීවිතය සාර්ථක කර ගැනීමට ඉවහල් වන බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. පළමු ගාථාව නිවැරදි ව සජ්ඣායනය කර අදහස දක්වන්න.
දෙවන ගාථාව නිවැරදි ව සජ්ඣායනය කර අදහස දක්වන්න.

කණ්ඩායම 2. මෙම ගාථා දෙකෙහි සරල අදහසින් තම ජීවිතවලට ගත හැකි ආදර්ශ ගොනු කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

- වෛරී සහගත සිතුවිලිවලින් මෙතෙක් තමාට සිදුවී ඇති අයහපත් අත්දැකීම් පූර්වාදර්ශ කොට, දරුවන්ට එසේ නොවීමට මග පෙන්වන්න.

**නිපුණතාව 03 :** බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි.
**නිපුණතා මට්ටම 7.3.1 :** සදාචාරවත් සමාජයක් සඳහා පංචසීල ප්‍රතිපත්තිය උපයෝගී වන බව පිළිගෙන ඒ අනුව ක්‍රියා කරයි.
**කාලච්ඡේද සංඛ්‍යාව :** 02 යි.

**ඉගෙනුම් පල :**

- සිල්පද පහ අරුත් සහිත ව පවසයි.
- පංචසීල ප්‍රතිපත්තියෙහි සාමාජික වටිනාකම පෙන්වා දෙයි.
- ''සදාචාරවත් සමාජයක් උදෙසා පංචසීලය සුරැකීම'' ගැන කතාවක් කරයි.
- නිවැරදි සමාජ සම්මතයනට අනුකූල ව කටයුතු කරයි.
- යහපත් සමාජයක කොටස්කරුවෙක් වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

පංචසීල ප්‍රතිපත්තියෙහි සාමාජික අගය දැන ඒ අනුව කටයුතු කිරීමට සිසුන්ට මගපෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- පුවත්පත් වාර්තා ඇසුරින් පන්සිල් කඩවූ අවස්ථා කිහිපයක් පන්තියට ඉදිරිපත් කරන්න.
- මෙවැනි සිදුවීම්වලට හේතු විමසන්න.
- මෙවැනි දුසිරිත් මගහරවා ගැනීමට පංචසීල ප්‍රතිපත්තිය ඉවහල් වන බව පවසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - පන්සිල් කඩවීම සමාජ පරිහානියට හේතු වේ.
  - පන්සිල් ආරක්ෂා කිරීමෙන් නීරෝගිමත් හා නිරවුල් ජීවිතයක් උදා කර ගත හැකි වේ.

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න. :
  - පන්සිල් අරුත් සහිත ව දැන ගත යුතු බව
  - පන්සිල් සුරැකීම ප්‍රතිපත්ති ගරුක බෞද්ධ සමාජයක පදනම බව
  - පුද්ගල මෙන් ම සමාජ දියුණුවට ද පංචසීල ප්‍රතිපත්තිය ඉවහල් වන බව
  - පන්සිල් සුරකින්නා සිවිල් සමාජ නීතිරීති ආරක්ෂා කරන බව
  - පන්සිල් සුරැකීමෙන් නීරෝගිමත් ජීවිතයක් ගත කළ හැකි බව
  - පන්සිල් සුරැකීම ප්‍රතිපත්ති ගරුක බෞද්ධ සමාජයක පදනම බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. පන්සිල් පිළිවෙළින් ලියා එහි සරල තේරුම් ලියා දක්වන්න.

කණ්ඩායම 2. පංචසීල ප්‍රතිපත්තිය යහපත් සමාජයකට හේතු වන ආකාරය පෙන්වා දෙන්න.

කණ්ඩායම 3. ''සදාචාරවත් සමාජයක් උදෙසා පංචසීලය සුරැකීම '' මැයෙන් කණ්ඩායමේ සියලු සාමාජිකයන් එක්ව කතාවකට සැකිල්ලක් සකසන්න.

**ගෙදර පරිසරයෙන්** :

තම නිවස තුළ නිරතුරු පන්සිල් සුරකින පරිසරයක් සකසා ඒ අනුව කටයුතු කිරීමට දරුවන් යොමු කරන්න.

**නිපුණතාව 03** : බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි.

**නිපුණතා මට්ටම 7.3.2** : ආජීව අෂ්ටමක සීලය පාදක කොට ගෙන තම ආධ්‍යාත්මික සංවර්ධනය ඇති කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- ආජීව අෂ්ටමක සීලය පංචසීල ප්‍රතිපත්තියෙන් වෙනස් වන ආකාරය ප්‍රකාශ කරයි.
- ආජීව අෂ්ටමක සීලය ආධ්‍යාත්මික සංවර්ධනයට වඩාත් හේතු කාරක වන බව පිළිගනියි.
- ආජීව අෂ්ටමක සීලය සමාදන් වන ආකාරය ප්‍රකාශ කර අදහස් දක්වයි.
- යහපත් සමාජ සම්මතයන්ට ගරු කරයි.
- නිවැරදි දිවි පැවැත්මකට හුරු වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

ආජීව අෂ්ටමක සීලය හඳුන්වා ආධ්‍යාත්මික සංවර්ධනය ඇති කර ගැනීම සඳහා සිසුන්ට මගපෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- පන්සිල් හැර ගිහි දිවිය තුළ සුරැකිය හැකි වෙනත් සිල් වර්ග මොනවා දැයි විමසන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - ආජීව අෂ්ටමක සීලය හා ගිහි දස සීලය සුරැකීම වැදගත් බව පැහැදිලි කරන්න.
    - ආජීව අෂ්ටමක සීලය ගිහියාට ප්‍රගුණ කළ හැකි සීලයේ ඉදිරි පියවරක් ලෙස පැහැදිලි කරන්න.
    - පැරණි බෞද්ධ සමාජය තුළ ආජීව අෂ්ටමක සීලයට උසස් තැනක් හිමි වූ බව පැහැදිලි කරන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න. :
- පංචසීල ප්‍රතිපත්තිය මෙන් ආජීව අෂ්ටමක සීලය ද ගිහි අපට සමාදන් විය හැකි බව
- ආජීව අෂ්ටමක සීලය, පංචසීල ප්‍රතිපත්තියට වඩා සීලයෙහි ඉදිරි පියවරක් බව
- පංචසීල ප්‍රතිපත්තියට වඩා ආජීව අෂ්ටමක සීලයෙහි වෙනසක් ඇති බව

- ''මිච්ඡාජීවා'' ................... සිල්පදය සමාදන් වීමෙන් සියලු ආකාර වැරදිවලින් මිදී යහපත් ජීවිතයක් ගත කළ හැකි බව.
- ආජීව අෂ්ටමක සීලය සමාදන් වීමෙන් සාර්ථක ගෘහ ජීවිතයක් ගත කිරීමට මග පැදෙන බව.

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. පංචසීල ප්‍රතිපත්තිය ආජීව අෂ්ටමක සීලයෙන් වෙනස් වන ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. පංචසීල ප්‍රතිපත්තියට වඩා ඉදිරි පියවරක් ලෙස ආජීව අෂ්ටමක සීලය පිළිගැනීමට හේතු දක්වන්න.

කණ්ඩායම 3. ආජීව අෂ්ටමක සීලය පිළිවෙළින් ලියා සරල අදහස දක්වන්න.

**ගෙදර පරිසරයෙන්** :

නිවසේ දෙමාපියන් හා දෛනික වන්දනා කටයුතුවල දී ආජීව අෂ්ටමක සීලය සමාදන් වී ආරක්ෂා කිරීමට සැලසුම් කර ගන්න.

**නිපුණතාව 03** : බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි.

**නිපුණතා මට්ටම 7.3.3** : බෞද්ධ සමාජ ධර්මවලට අනුගතවෙමින් ගුරු සිසු සබඳතා ගොඩනගා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- සිගාලෝවාද සූත්‍රයේ සඳහන් ගුරු ශිෂ්‍ය යුතුකම් පැහැදිලි කරයි.
- ගුරු භවතුන්ගේ ගුණ හැඳින ගෞරවයෙන් කටයුතු කළ යුතු බැව් පෙන්වා දෙයි.
- '' ගුරු ගෞරවයෙන් යුතුව කටයුතු කිරීමේ වැදගත්කම'' යන මැයෙන් කතාවකට උචිත සැලසුම සකස් කරයි.
- තම යුතුකම් මැනවින් ඉටු කරයි.
- ගුරු ගෞරවයෙන් යුතුව කථා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

ගුරුවරුන්ගේ ගුණ හැඳින ගුරු ගෞරවය රැකෙන පරිදි කටයුතු කරන අයුරු විස්තර කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- ''ඕවාද සිප්ප දානේන ............ '' ගුරු වන්දනා ගාථාව දැක්වෙන පුවරුව ඉදිරිපත් කර සජ්ඣායනා කරන්න.
- ගුරු භවතුන් සමාජය තුළ උතුම් මෙහෙවරක යෙදෙන බැව් පැහැදිලි කරන්න.
- ගුරුවරයා ශිෂ්‍යයා වෙනුවෙන් විශාල මෙහෙවරක යෙදෙන බව පැහැදිලි කරන්න.
- මේ පිළිබඳ ව බුදුරජාණන් වහන්සේ සිගාලෝවාද සූත්‍රයේ කරුණු ගෙනහැර දක්වා ඇති බව පෙන්වා දෙන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බුදුරජාණන් වහනසේ ද සිය ධර්මය ගුරු තන්හි තබා කටයුතු කළ බව
  - සැරියුත් මහරහතන් වහන්සේ නිතිපතා ගුරු ගෞරවයෙන් කටයුතු කළ බව
  - සිගාලෝවාද සූත්‍රයේ දක්ඛිණ දිසාවෙන් ගුරු සිසු සබඳතා පැහැදිලි කරන බව

- සිගාලෝවාද සූත්‍රයට අනුව ගුරු - සිසු සබඳතා වෙන් වෙන්ව දේශනා කර ඇති බව
- ගුරු - සිසු සබඳතා වලින් සමාජයේ පැවැත්මට අමිල මෙහෙවරක් ඉටු වන බව
- ගුරුවරයාගෙන් ඉටුවන මෙහෙය මුදලට සරි කළ නොහැකි බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. සිගාලෝවාද සූත්‍රයට අනුව ගුරු - සිසු යුතුකම් වෙන වෙනම දක්වන්න.

කණ්ඩායම 2. ගුරු ගෞරවයෙන් යුතුව කටයුතු කිරීමේ ආනිශංස ... යන මැයෙන් කතාවකට උචිත සැකිල්ලක් සකස් කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

පාසලේ සිටින ගුරු භවතුන් පමණක් නොව සමාජයේ දී තමාට අවවාද අනුශාසනා, මගපෙන්වීම් ලබා දෙන අයට ගුරු ගෞරවයෙන් කටයුතු කරන්නට මග පෙන්වන්න.

නිපුණතාව 04 : සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට කටයුතු කරයි.

නිපුණතා මට්ටම 7.4.1 : නායකයකුගේ වගකීම හා වගවීම තේරුම් ගෙන ඒ අනුව තම පෞරුෂය ගොඩනගා ගනී.

කාලච්ඡේද සංඛ්‍යාව : 02යි.

ඉගෙනුම් පල :

- නායකයකුගේ වගකීම හා වගවීම පැහැදිලි කරයි.
- තම පෞරුෂය ගොඩනගා ගැනීමට වගකීම හා වගවීම හේතු වන බව පිළිගනියි.
- නායකත්ව ලක්ෂණ ලැයිස්තු ගත කරයි.
- නායකත්වයට ගරු කරයි.
- නායකයකු ලෙස කටයුතු කරයි.

පාඩම් සැලසුම් සඳහා උපදෙස් :

අපණ්ණක ජාතකය මගින් නායකත්ව ලක්ෂණ පැහැදිලි කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

පියවර 1 :

- නායක යන වචනය භාවිත නොකර නායකයකු සතු යහපත් ලක්ෂණ කීපයක් ඉදිරිපත් කරන්න.
- මෙම ලක්ෂණ දක්නට ලැබෙන්නේ කවුරුන් තුළ දැයි විමසන්න.
- තවත් බොහෝ ලක්ෂණ නායකයකු සතු වන බව සාකච්ඡා කරන්න.
- යහපත් නායකත්ව ලක්ෂණ බොහොමයක් ජාතක කතාවල විද්‍යමාන වන බව පැහැදිලි කරන්න.
- අපණ්ණක ජාතකයේ සාරාංශය පන්තියට ඉදිරිපත් කරන්න.
- යහපත් අරමුණක් කරා තම කණ්ඩායම නිවැරදි ව මෙහෙයවීම නායකත්ව ලක්ෂණයක් බව පැහැදිලි කරන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
    - බුදුරජාණන් වහන්සේ පූර්ව භවයන්හි දී නිවැරදි නායකත්ව ලක්ෂණ පෙන්වා ඇති බව
    - වගකීම හා වගවීම නායකත්ව ලක්ෂණ අතර ප්‍රධාන තැනක් ගන්නා බව
    - අපණ්ණක ජාතකය මේ අතර ප්‍රධානත්වයෙහිලා පෙන්විය හැකි බව

- නායකයාගේ කුඩා හෝ දුර්වලතාවක් අනුගාමිකයන්ගේ පැවැත්මට බලපාන බව
- යහපත් නායකයකුවීම සඳහා කුඩා කල සිටම නායකත්ව ලක්ෂණ ප්‍රගුණ කළ යුතු බව
- නිවැරදි නායකත්ව පෞරුෂයක් ගොඩනගා ගැනීම සඳහා අපණ්ණක ජාතකයෙන් බොහෝ ආදර්ශ ගත හැකි බව.

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. අපණ්ණක ජාතකයෙන් මතුවන බෝසතාණන් වහන්සේගේ නායකත්ව ලක්ෂණ හැඳින ගෙන ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 2. ශිෂ්‍යයකු ලෙස ඔබ තුළ සංවර්ධනය කර ගත යුතු අනුගාමිකත්ව ලක්ෂණ, පෙළගස්වන්න.

කණ්ඩායම 3. ශිෂ්‍ය නායකයකු ලෙස ඔබ වර්ධනය කර ගත යුතු නායකත්ව ලක්ෂණ පෙළගස්වන්න.

**ගෙදර පරිසරයෙන් :**

මවුපියන් ලෙස දරුවන්ට යම් යම් වගකීම් පවරා ඔවුන්ට නායකත්ව ලක්ෂණ ගොඩනගා ගැනීමට මග පෙන්වන්න.

**නිපුණතාව 04** : සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට කටයුතු කරයි.
**නිපුණතා මට්ටම 7.4.2** : ඉවසීමෙන් යුතුව ලෝක ස්වභාවයට මුහුණ දෙයි.
**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- ඉවසීමේ ගුණාංග පැහැදිලි කරයි.
- අවස්ථානුකූල ව ඉවසීම ප්‍රගුණ කළ යුතු බව පෙන්වා දෙයි.
- ඉවසීමේ ආනිශංස හා නොඉවසීමේ ආදීනව ලැයිස්තු ගත කරයි.
- අන් මත පිළිබඳ ව සැලකිලිමත් වෙයි.
- ඉවසීමෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

ඉවසන්නකු තුළ තිබිය යුතු ගුණාංග, ඉවසීම ප්‍රගුණ කළ යුතු අවස්ථා, නොඉවසීමෙන් ලැබෙන අයහපත් ප්‍රතිඵල හා ඉවසීමෙන් ලැබෙන යහපත් ප්‍රතිඵල පිළිබඳ පැහැදිලි කරදීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- දරුවන් දෙදෙනෙකු හෝ කීපදෙනෙකු සහභාගි කරවා ගනිමින් මහමග දී ඉවසීම නොමැතිව කටයුතු කිරීමෙන් සිදු වන බහින්බස් වීමක් අඬදබරයක් දක්වා වර්ධනය වන අවස්ථාවක් නිර්මාණය කර, දරුවන් භූමිකා රංගනයක යොදවන්න. එම රංගනය මගින් පහත සඳහන් කරුණු මතු කර ගන්න.
  - ඉහත සිද්ධියෙන් නොඉවසිලිමත් බව හේතු කොට ගෙන සිදු වූ විපත පැහැදිලි කරන්න.
  - එක් අයෙකු හෝ ඉවසීමෙන් කටයුතු කළේ නම් මෙම විපත වළක්වා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.
  - ජීවිත සාර්ථකත්වය උදෙසා ඉවසීම අත්‍යවශ්‍ය ගුණාංගයක් බව පැහැදිලි කරන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - ඉවසීම යහපත් ගුණාංගයක් බව
  - ඉවසීම ප්‍රගුණ කළ යුතු අවස්ථා හැඳින ගත යුතු බව
  - අයුක්තියේ දී නිහඬ ව සිටීම සැබෑ ඉවසීම නොවන බව

- ඉවසීමෙන් යහපත් ප්‍රතිඵල රැසක් ඇති කර ගත හැකි බව
- ජීවිත ගැටලු බොහොමයකට නොඉවසීම හේතු වන බව
- පාරිසරික හා කායික ගැටලුවල දී ද ඉවසීම ප්‍රගුණ කළ යුතු බව
- ශිෂ්‍ය ජීවිතයේ සාර්ථකත්වය සඳහා ඉවසීම ප්‍රගුණ කළ යුතු බව
- ඉවසීම තුළින් ජීවිතය ජය ගත හැකි බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. ඉවසන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 2. ඉවසීම ප්‍රගුණ කළ යුතු අවස්ථා ලැයිස්තු ගත කරන්න.

කණ්ඩායම 3. ඉවසීමෙන් ලැබෙන යහපත් ප්‍රතිඵල හා නොඉවසීමෙන් ලැබෙන අයහපත් ප්‍රතිඵල ලැයිස්තු ගත කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

දෙමාපිය, දූ දරු අන්තර් ක්‍රියාවන්හිදී ඉවසීම ප්‍රගුණ කිරීමට හුරු කිරීම.

**නිපුණතාව 05** : ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 7.5.1** : බුදු දහම ඇසුරින් පෝෂණය වූ ශ්‍රී ලාංකික සමාජ ධර්ම රැක ගැනීමට ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- බුදු දහමින් පෝෂණය වූ ශ්‍රී ලාංකික ජන සමාජයේ සුවිශේෂී ලක්ෂණ නම් කරයි.
- බුදු දහමින් පෝෂිත සංස්කෘතික ලක්ෂණ ජාතික ප්‍රෞඪත්වයට හේතු වන බව පිළිගනිමින් කටයුතු කරයි.
- ශ්‍රී ලාංකික ජන සමාජයේ සුවිශේෂී ලක්ෂණ කීපයක් නිරූපණය කරයි.
- පාසල් සංස්කෘතියේ සුවිශේෂී ලක්ෂණයන්ට අනුගත ව ක්‍රියා කරයි.
- ජන සංස්කෘතියේ සුවිශේෂී ලක්ෂණයන්ට ගරු කරමින් සුරක්ෂිත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

බුදු දහම ඇසුරින් පෝෂණය වූ ශ්‍රී ලාංකික ජන සංස්කෘතියේ සුවිශේෂී ලක්ෂණ යටතේ කළගුණ සැලකීම, ආගන්තුක සත්කාර, වැඩිහිටියන්ට සැලකීම, අග්‍ර ශෂ්‍ය දානය, භික්ෂු නායකත්වය, පිළිගැනීම යන කරුණු අවබෝධ කර දීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට අලුත් සහල් මංගල්‍යයක් පවත්වන පින්තූරයක් දරුවන්ට ප්‍රදර්ශනය කරන්න. පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.
  - වී වපුරා ලබා ගන්නා පළමු ඇස්වැන්නේ ප්‍රථම භාගය රජරට ගොවීන් ශ්‍රී මහා බෝධීන් වහන්සේට පූජා කිරීම අග්‍ර ශස්‍ය දානය ලෙස හැඳින්වෙන බව පවසන්න.
  - මෙසේ ඕනෑම අස්වැන්නක ප්‍රථම භාගය බුදුරජාණන් වහන්සේට පූජා කිරීම අග්‍ර ශස්‍ය දානය ලෙස හඳුන්වා දෙන්න.
  - අග්‍ර ශස්‍ය දානය ශ්‍රී ලාංකික ජන සංස්කෘතියේ සුවිශේෂී ලක්ෂණයක් බව පැහැදිලි කරන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - ශ්‍රී ලාංකික බෞද්ධ ජන සමාජයටම ආවේණික වූ සංස්කෘතික ලක්ෂණ ඇති බව.

- කළගුණ සැලකීම, ආගන්තුක සත්කාරය, වැඩිහිටියන්ට සැලකීම, අග්‍ර ශස්‍ය දානය, භික්ෂු නායකත්වයට ගරු කිරීම ඒ අතර සුවිශේෂී වන බව
- මෙම ලක්ෂණ අතීත ජන සමාජයේ ද මැනවින් ප්‍රදර්ශනය වූ බව
- වර්තමාන සමාජය තුළ ද පැවත ගෙන ආ ජන සංස්කෘතික ලක්ෂණ ප්‍රගුණ කළ යුතු බව
- පැවත ගෙන ආ සංස්කෘතියෙන් උරුම වූ ගුණාංග පරපුරෙන් පරපුරට දායාද කළ යුතු බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. කළගුණ සැලකීම සහ ආගන්තුක සත්කාරය සිදු කරන ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. වැඩිහිටියන්ට සැලකීමේ වටිනාකම සහ සලකන ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. අග්‍ර ශස්‍ය දානය යනු කුමක් දැයි හඳුන්වා නිවසේ දී ඔබට එය සිදු කළ හැකි ආකාරය පෙන්වා දෙන්න.

කණ්ඩායම 4. භික්ෂු නායකත්වය පිළිගැනීම පිළිබඳ භූමිකා රංගනයක් ඉදිරිපත් කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

කළගුණ සැලකීම, ආගන්තුක සත්කාරය, වැඩිහිටියන්ට සැලකීම, අග්‍ර ශෂ්‍ය දානය, භික්ෂු නායකත්වය පිළිගැනීම ආදියට උචිත අවස්ථා උදා කොට, තම දරුවන් ද සමඟ එම කටයුතුවල නිරත වන්න.

**නිපුණතාව 05** : ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 7.5.2** : බෞද්ධ ඉගැන්වීම් ශ්‍රී ලාංකික ජන සමාජයේ පදනම බව දැන සහයෝගිත්වයෙන් කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- ශ්‍රී ලාංකික ජන සමාජය සහජීවනයට පදනම් වූ බෞද්ධ ඉගැන්වීම් පැහැදිලි කරයි.
- බුදු දහමෙහි ඉගැන්වෙන සහජීවනයෙන් යහපත් ශ්‍රී ලාංකික ජන සමාජයක් ගොඩනැගුන බව පිළිගනියි.
- ''සහජීවනයට අදාළ වන බෞද්ධ ඉගැන්වීම් යහපත් සමාජයක් සඳහා උපකාරවත් වෙයි'' යන මැයෙන් කතාවක් පවත්වයි.
- අන් සිසුන් සමඟ සහයෝගයෙන් කටයුතු කරයි.
- සහජීවනයෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

ශ්‍රී ලාංකික ජන සමාජයේ සහජීවනයට පදනම් වූ බෞද්ධ ඉගැන්වීම් (සහජීවන සංකල්පය), අවිහිංසාව, සමානාත්මතාව, අන්‍ය මත ඉවසීම පිළිබඳ අවබෝධය ලබාදීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- ''ලොවේ සැමා එකම දූයේ දූ දරුවන් වේවා ...'' යන ගීතය ලියූ පුවරුව පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එම ගීතය සිසුන් සමඟ තාලයට ගයන්න.
- එහි අදහස සිසුන් සමග සාකච්ඡා කරන්න.
- අතීතයේ ශ්‍රී ලාංකිකයින් සහජීවනයෙන් ක්‍රියා කළේ බුදු දහමෙන් ලැබූ ආභාසය නිසා බව පෙන්වා දෙන්න.
- සහයෝගයෙන් සමාදානයන් කටයුතු කිරීම මගින් සහජීවනය උදාවන බව පැහැදිලි කරන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
    - බෞද්ධ ඉගැන්වීම් තුළින් යහපත් ජන සමාජයක් ගොඩනැගුන බව

- අතීත ජන සමාජයෙන් ඒ සඳහා නිදසුන් පෙන්වා දිය හැකි බව
- සහජීවන සංකල්පය, අවිහිංසාව, සමානාත්මතාව හා අන්‍ය මත ඉවසීම ඒ අතර ඉතා වැදගත් ස්ථානයක් උසුලන බව
- බුදු සිරිතෙන් එම ගුණාංගවලට නිදසුන් පෙන්වා දිය හැකි බව
- වර්තමාන සමාජයේ ද මෙම ඉගැන්වීම් ප්‍රගුණ කිරීමෙන් සහජීවනයෙන් ක්‍රියා කළ හැකි බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. අතීත ජන සමාජය සහජීවනයෙන් කටයුතු කළ බවට නිදසුන් ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 2. බුදු සිරිතෙන් සහජීවන සංකල්පය මූර්තිමත් වන අවස්ථා පහදන්න.

කණ්ඩායම 3. සහයෝගයෙන් කටයුතු කිරීමේ වැදගත්කම යහපත් සමාජයකට පදනම් වන ආකාරය දක්වමින් කතාවක් කිරීමට සැකිල්ලක් සකස් කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

ජනවර්ගය, ආගම, කුලය ආදිය නොසලකා අසල්වැසියන් සමග සහජීවනයෙන් කටයුතු කරමින් දරුවන් ද ඒ සඳහා පෙළඹවීම.

**නිපුණතාව 06** : බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 7.6.1** : ජීවිතය හා සම්බන්ධ සියල්ල ම සිදුවන්නේ පූර්ව කර්මයෙන් නොවන බව පිළිගෙන කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- නියාම ධර්ම පැහැදිලි කරයි.
- ජීවිතය හා සම්බන්ධ සියල්ලම පූර්ව කර්මයෙන් සිදු නොවන බව පිළිගනියි.
- නියාම ධර්මවලට අදාළව කාලීන නිදසුන් ලේඛනයක් සකස් කරයි.
- භාග්‍ය වාදයෙන් මිදී අධ්‍යාපනයේ යෙදේ
- සියල්ල පෙර කර්මයෙන් සිදු නොවන බව දැන කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

නියාම ධර්ම පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාදීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- කඳු නාය යාම, ගංවතුර, නියං ප්‍රදේශ ඇතිවීම ආදී ස්වභාවික විපත්වල පින්තූර ප්‍රදර්ශනය කිරීම.
- ඒවායෙහි තොරතුරු විමසීම
- මෙවැනි සිදුවීම්වලට හේතුව කුසල හෝ අකුසල කර්මවල බලපෑමක් නොවන බව පැවසීම.
- පාරිසරික වෙනස්කම් හේතු කොට ගෙන සිදුවන වෙනස්වීම් කර්ම විපාක නොවන බව පැහැදිලි කරන්න.
- දෛනික ජීවිතයේ දී ස්වාභාවික විපත්වලට මුහුණ දීමට සිදුවන බවත් ඒවාට දිරිමත්ව මුහුණ දිය යුතු බවත් පෙන්වා දෙන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බුදු දහම පුබ්බේකත හේතුවාදයක් නොවන බව
  - නියාම ධර්ම මගින් මෙය පැහැදිලි වන බව
  - නියාම ධර්ම තුළ කර්ම නියාම ද ඇතුළත් වන බව

- එක් සිදුවීමක් තුළ නියාම ධර්ම කීපයක බලපෑමක් ඇති විය හැකි බව
- තමා වෙත එල්ල වෙන සියලු අභියෝග පූර්ව කර්මයට පවරා බලා නොසිටිය යුතු බව
- යහපත් ක්‍රියා මඟින් කර්මය ජය ගත හැකි බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. නියාම ධර්ම පහ නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. ශිෂ්‍ය ජීවිතයේ දී මුහුණ දෙන අභියෝග දෛවයට හා කර්මයට භාර නොදී උත්සාහයෙන් ක්‍රියා කළ යුතු ආකාරය පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

කරුම දෝස, අපල, අභාග්‍ය සංකල්පවලට යට නොවී උත්සාහයෙන් කටයුතු කිරීමට දරුවන් යොමු කිරීම.

**නිපුණතාව 06** : බුදුදහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 7.6.2** : චතුරාර්ය සත්‍ය හැඳින ධර්මය කෙරෙහි පැහැදීමෙන් කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- චතුරාර්ය සත්‍ය නිවැරදි ව නම් කරයි.
- දුක පිළිබඳ ගැටලුව විසඳා ගැනීමට චතුරාර්ය සත්‍යය මග පෙන්වන බව පිළිගනියි.
- චතුරාර්ය සත්‍යය ගැලීම් සටහනකින් නිරූපණය කොට දක්වයි.
- ගැටලු හැඳින ගෙන ඒවා විසඳා ගැනීමට කටයුතු කරයි.
- ගැටලු නිවැරදි ආකාරයට විසඳා ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

චතුරාර්ය සත්‍යය පිළිබඳ මූලික හැඳින්වීමක් ලබාදීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- ගැටලුවක් මතු වූවිට එය විසඳා ගැනීමට ගත යුතු ක්‍රියා පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.
    1. ගැටලුව
    2. ගැටලුව ඇති වීමට හේතුව
    3. ගැටලුව නැති කිරීම
    4. ගැටලුව නැති කිරීමේ මාර්ගය

- යමක් විශ්ලේෂණය කර ගැනීම මගින් කරුණු සොයා ගැනීම පහසු බව පැහැදිලි කරන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
    - චතුරාර්ය සත්‍යය බුදුදහමේ මූලික ඉගැන්වීමක් බව.
        - ඇති වන්නාවූ ඕනෑම ගැටලුවක් චතුරාර්ය සිද්ධාන්තයට අනුව විසඳා ගත හැකි බව
        - චතුරාර්ය සත්‍යය කොටස් 4 කින් යුක්ත බව
        - එය 1. දුක්ඛ ආර්ය සත්‍යය
            2. දුක්ඛ සමුදය ආර්ය සත්‍යය
            3. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය
            4. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය නම් වන බව
        - දෛනික කාර්යයන්හිදී මතුවන ගැටලු චතුරාර්ය සත්‍ය සිද්ධාන්තයට අනුව විසඳා ගත හැකි බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. චතුරාර්ය සත්‍යය ගැලීම් සටහනක් මගින් පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. එදිනෙදා ජීවිතයේ ගැටලු චතුරාර්ය සත්‍ය ක්‍රමය පදනම් කරගෙන විසඳා ගන්නා අයුරු නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

දෛනික කාර්යයන්හි දී මතු වන ගැටලු නිවැරදි ව විසඳා ගැනීමේ දී චතුරාර්ය සත්‍ය සිද්ධාන්තය උදව් කර ගත හැකි බව දරුවන්ට පැහැදිලි වනසේ බුද්ධිමත්ව ගැටලු නිරාකරණය කර ගන්න.

**නිපුණතාව 07** : ජීවී අජීවී පරිසරයට හිතකාමී ව හැසිරෙයි.

**නිපුණතා මට්ටම 7.7.1** : තමා උපමාවට ගනිමින් ජීව හිතවාදී ආකල්ප ගොඩනගා ගනී.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- වේළුද්වාර සූත්‍රයේ දැක්වෙන අත්තූපනායික ධර්මය පැහැදිලි කරයි.
- තමා උපමා කොට කටයුතු කළ යුතු බව පිළිගනියි.
- අධිපති ධර්ම පැහැදිලි කරමින් බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කරයි.
- අන්‍යයන් ද තමා මෙන් සලකා කටයුතු කරයි.
- පරහිතකාමී වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

අත්තූපනායික ධර්ම පර්යාය හා අධිපති ධර්ම පැහැදිලි කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- ''අත්තානං උපමංකත්වා............... '' යන ගාථාව දරුවන්ට පෙනෙන්නට පුවරුවේ ලියා ආදර්ශ කොට සජ්ඣායනය කිරීම.
- තමා උපමා කොට අන් අයට හිංසා නොකිරීම මෙම ගාථාවෙන් කියවෙන බව පෙන්වන්න.
- මෙය අත්තූපනායික ධර්මය ලෙස පැහැදිලි කරන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - තමා උපමා කොට අන් අය කෙරෙහි කටයුතු කිරීම අත්තූපනායික ධර්මය බව
  - වේළුද්වාර සූත්‍රයේ නිදාන කතාවෙන් මෙය පැහැදිලි වන බව.
  - අධිපති ධර්ම මගින් ද නිවැරදි ජීවිතයකට මග පෙන්වන බව.
  - මෙම ඉගැන්වීම මගින් යහපත් සමාජ සම්බන්ධතා ගොඩනැගෙන බව
  - මෙම ධර්ම ආරක්ෂා කිරීමෙන් ජීව හිතවාදී ආකල්ප ඇති වන බව
  - යහපත් ධර්ම පිළිපැදීමෙන් ශිෂ්‍ය ප්‍රචණ්ඩත්වය අවම වන බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 01 : වේළුද්වාර සූත්‍රයේ එන අත්තූපනායික ධර්මය පැහැදිලි කරන්න.

කණ්ඩායම 02 : අධිපති ධර්ම ඇසුරින් බිත්ති පුවත්පතකට සපයන ලිපියකට ඇතුළත් කෙරෙන කරුණු ගොනු කරන්න.

කණ්ඩායම 03 : අනුන්ගේ සිතුම් පැතුම් තේරුම් ගෙන ඒ අයට හිතකර ලෙස කටයුතු කිරීමෙන් යහපත් සමාජ වාතාවරණයක් ගොඩනැගෙන අයුරු පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

නිවසේ කටයුතු සංවිධානයේ දී අසල්වැසි නිවෙස්වලට හිරිහැර නොවන ලෙස කටයුතු කරමින් දරුවන් ද ඊට පුහුණු කරන්න.

**නිපුණතාව 07** : ජීවී අජීවී පරිසරයට හිතකාමී ව හැසිරෙයි.

**නිපුණතා මට්ටම 7.7.2** : මානව සබඳතා පවත්වා ගැනීමට ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුතුව ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි

**ඉගෙනුම් පල** :

- යහපත් මානව සබඳතා පවත්වා ගන්නේ කෙසේ දැයි පැහැදිලි කරයි.
- මානව සබඳතා පවත්වා ගැනීමේ දී අවස්ථාවෝචිත ව ක්‍රියා කිරීමේ වැදගත්කම පිළිගනියි.
- අන් අයගේ සිත් දිනා ගත හැකි, විවිධ ස්ථානවලට යෝග්‍ය, දෙබස් කීපයක් නිර්මාණය කරයි.
- දෛනික චර්යාවෙහි ප්‍රියශීලීව හැසිරෙයි.
- මනා අන්‍යෝන්‍ය සබඳතා ගොඩනගා ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

කතා බහ සහ හැසිරීම යන චර්යා රටාවල දී හා පාසල් පිරියත, පන්සල, නිවස යන ස්ථානවල මානව සබඳතා පවත්වා ගැනීමේ දී ස්ථානෝචිත ප්‍රඥාවෙන් කටයුතු කිරීමට මග පෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- සිරිත් මල්දමේ යෝග්‍ය කවි කීපයක් පුවරුවේ ප්‍රදර්ශනය කොට ගායනා කරන්න.
- එය ශ්‍රවණය කිරීමට සලස්වා ඒවා දරුවන් සමඟ ගායනා කරන්න.
- ප්‍රියශීලීව කතා කිරීම කවියෙන් පැවසෙන බව පැහැදිලි කරන්න.
- ඒ ඇසුරින් සුදුසු පරිදි සාකච්ඡාව ගොඩනගන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
    - මානව සබඳතා යනු විවිධ සමාජ කණ්ඩායම් සමග සුහදශීලීව කටයුතු කිරීම බව
    - කතා බහ සහ හැසිරීම අවස්ථාවෝචිත ව සිදු කළ යුතු බව
    - පාසල, පන්සල හා නිවස යන ස්ථානවල දී ඊටම ආවේණික හැසිරීම් රටා පවත්වා ගත යුතු බව
    - මෙම ස්ථානවලට යෝග්‍ය යහපත් වදන් භාවිත කළ යුතු බව
    - ස්ථානෝචිත ව කටයුතු නොකිරීමෙන් ගැටලු සහගත තත්ත්වයන්ට මුහුණදීමට සිදුවිය හැකි බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

පහත සඳහන් ස්ථානයන්හි ආදර්ශවත් හැසිරීම, කතා බහ ප්‍රදර්ශනය වන සේ සංවාදාත්මක ව රඟ දැක්වීමක යෙදෙන්න.

| | | |
|---|---|---|
| කණ්ඩායම | 1. | පන්සල |
| කණ්ඩායම | 2. | පාසල |
| කණ්ඩායම | 3. | නිවස |

**ගෙදර පරිසරයෙන් :**

පාසල, පන්සල සහ නිවස යන ස්ථානයන්හි ප්‍රායෝගිකව කටයුතු කරන අවස්ථාවල අවස්ථාවෝචිතව නිවැරදිව හැසිරෙමින් එම අත්දැකීම් දරුවන්ට ද අත්පත් කර ගැනීමට පොළඹවන්න.

**නිපුණතාව 08** : ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 7.8.1** : මහින්දාගමනයෙන් ශ්‍රී ලාංකිකයන් ලද දායාද හැඳින ඒවා ශාසනික හා සංස්කෘතික වශයෙන් ඇගයීමට ලක් කරමින් සංරක්ෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- මහින්දාගමනයෙන් ලත් දායාද මොනවා දැයි පැහැදිලි කරයි.
- ශ්‍රී ලාංකිකයන්ට උරුම වූ එම දායාද සංරක්ෂණය කළ යුතු බව පිළිගනියි.
- මහින්දාගමනයෙන් ලත් දායාද ඇසුරින් ප්‍රදර්ශනයක් කරයි.
- ශාසනික හැඟීමෙන් යුක්ත ව කටයුතු කරයි.
- ශාසනික හා සංස්කෘතික දායාද ආරක්ෂා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

මහින්දාගමනයෙන් ලත් ශ්‍රී ලාංකික දායාද වන බුදු දහම, බෞද්ධ සිද්ධස්ථානයක අංග, භික්ෂු භික්ෂුණී පැවිද්ද, කලා ශිල්ප හා සාහිත්‍යය පිළිබඳ අවබෝධාත්මක හැඟීමක් ලබාදීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- බෞද්ධ සිද්ධස්ථානයක අංගයන්හි ඡායාරූප, භික්ෂු භික්ෂුණී ඡායාරූප, සඳකඩපහණ හා මුරගල ඡායාරූප සහ පුස්කොළපොත, අමාවතුර, බුත්සරණ වැනි ග්‍රන්ථ කීපයක් ප්‍රදර්ශනය කිරීම.
- ඉහත සඳහන් ඡායාරූප සහ ග්‍රන්ථ පිළිබඳව දරුවන්ගෙන් විමසීම.
- සිසුන් සමඟ සාකච්ඡාවක් මෙහෙයවමින් ඉහත සඳහන් දේ මහින්දාගමනයෙන් ලත් දායාද බව පැහැදිලි කිරීම.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට කලින් ලබාදුන් ගවේෂණ පත්‍රිකා ගැන සිහිපත් කර අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
    - මහින්දාගමනයෙන් දායාද රැසක් උරුම වූ බව
    - බුදු දහම, බෞද්ධ සිද්ධස්ථානයක අංග, භික්ෂු - භික්ෂුණී පැවිද්ද, කලා ශිල්ප හා සාහිත්‍යය ඒ අතර ප්‍රධාන අංග බව

- මෙම සංස්කෘතිකාංග මගින් ජාතික හා ආගමික පුනර්ජීවයක් ඇති වූ බව
- හැකි සෑම විටම අතීත උරුමයන් පිළිබඳ ව අධ්‍යයනය කොට නිවැරදි තොරතුරු ලබාගත යුතු බව
- මෙම දායාද සංරක්ෂණය කළ යුතු බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** : (මෙම පත්‍රිකාව පාඩම නියමිත දිනට පෙර බෙදා දෙන්න.)

කණ්ඩායම 1. බෞද්ධ සිද්ධස්ථානයක අංග

කණ්ඩායම 2. බෞද්ධ කලා ශිල්ප (සඳකඩපහණ, මුරගල, චිත්‍ර)

කණ්ඩායම 3. සාහිත්‍ය කෘති - (පුස්කොළ පොත්, පැරණි සාහිත්‍ය කෘති) පන්ති කාමරයේ දී මේවා ඇසුරින් ප්‍රදර්ශනයක් පවත්වන්න.

**ගෙදර පරිසරයෙන්** :

ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතිකාංග වටිනාකම් හා වැදගත්කම් දරුවන්ට වටහා දී ඒවා සංරක්ෂණයට කටයුතු කරන්න.

**නිපුණතාව 09** : බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 7.9.1** : ධන පරිහරණයට අදාළ බෞද්ධ ඉගැන්වීම් අනුගමනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- සම්පත් කළමනාකරණයේ ඇති වැදගත්කම පැහැදිලි කරයි.
- සම්පත් කළමනාකරණයෙන් යහපත් ආර්ථික පසුබිමක් ඇති කර ගත හැකි බව පිළිගනියි.
- ''සීමිත සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමේ වැදගත්කම'' පිළිබඳ ව කතාවක් පවත්වයි.
- පාසලේ දේපළ සුරකියි.
- සාංඝික දේපළ පිළිබඳ නිවැරදි ආකල්පයෙන් යුතුව කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

දේපොළ පරිහරණය හා නඩත්තුව, සමජීවිකතාව, අබලි දේ අලුත්වැඩියාව, පූජාවක් වශයෙන් ලැබෙන චීවරයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගන්නා අයුරු හා පොදු දේපොළ පරිහරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් හඳුන්වා දී ඒවා තම ප්‍රායෝගික ජීවිතයට සම්බන්ධ කර ගැනීමට මග පෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- පාසලේ සහ නිවසේ අබලි භාණ්ඩ සම්බන්ධයෙන් සිසුන් ක්‍රියා කරන ආකාරය විමසන්න. පහත සඳහන් කරුණු මතු කරමින් කෙටි සාකච්ඡාවක යෙදෙන්න.
  - පාසලේ සහ නිවසේ අබලි ද්‍රව්‍ය පිළිසකර කොට නැවත පරිහරණයට ගැනීමේ හැකියාව පහදන්න.
  - පවතින සීමිත සම්පත් අරපරිස්සමෙන් පරිහරණය මෙන් ම නඩත්තුව ද වැදගත් බව අවධාරණය කරන්න.
  - මේ සම්බන්ධ බුදු දහමේ ඉගැන්වීම් හැදෑරීම වැදගත් බව පැහැදිලි කරන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - පොදු දේපළ සහ ධන පරිහරණයට අදාළ බෞද්ධ ඉගැන්වීම් රැසක් ඇති බව
  - සමජීවිකතාව, චීවර පරිහරණය, සාංඝික දේපළ පරිහරණය ඒ අතර වැදගත් බව

- පවත්නා සම්පත් අරපිරිමැස්මෙන් පරිහරණය කළ යුතු බව
- කැඩුණු බිඳුණු සම්පත් පිළිසකර කොට නැවත පරිහරණයට ගත යුතු බව
- පාසලේ සහ නිවසේ පවත්නා ප්‍රයෝජනයට ගත හැකි කැඩුණු බිඳුණු දෑ පිළිසකර කොට පරිහරණය කළ යුතු බව
- පුද්ගල දියුණුව සඳහා අරපරිස්සමින් යුතුව සම්පත් පරිහරණය කිරීම වැදගත් බව
- ඉවතලන බොහෝ ද්‍රව්‍ය නැවත පරිහරණය සඳහා වෙනස් මුහුණුවරකින් සකස් කර ගැනීමෙන් ආර්ථික වාසි රැසක් ලබාගත හැකි බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. බුදු දහමට අනුව පොදු දේපළ පරිහරණයේ දී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග පෙන්වා දෙන්න.

කණ්ඩායම 2. ''සීමිත සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගනිමු.''
යන මාතෘකාව යටතේ කතාවක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය තොරතුරු ඇතුලත් සැකිල්ලක් සකස් කරන්න.

කණ්ඩායම 3. ඉවතලන බොහෝ ද්‍රව්‍ය නැවත පරිහරණය සඳහා වෙනස් මුහුණුවරකින් සකස් කර ගැනීමෙන් ආර්ථික වාසි රැසක් ලබාගත හැකි බව පැහැදිලි කරමින් කතාවක් පවත්වන්න.

**ගෙදර පරිසරයෙන්** :

නිවසේ පවත්නා සම්පත් අරපිරිමැස්මෙන් පරිහරණය කිරීමට හා කැඩුණු බිඳුණු දෑ පිළිසකර කර නැවත පරිහරණයට දරුවන් යොමු කරන්න.

**නිපුණතාව 10** : නිර්වාණය අරමුණු කොට ගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි.
**නිපුණතා මට්ටම 7.10.1**: නිවැරදි දැක්මකින් හා මනා හැඟීමකින් යුතුව පුණ්‍ය ක්‍රියාවන් හි යෙදෙයි.
**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- කාව්‍යශේඛරයට අනුව පුණ්‍ය ක්‍රියා දොළසක් ඇති බව ප්‍රකාශ කරයි.
- පින්කම්හි අගය දැන එහි නියැළෙන්නට පෙලඹෙයි.
- තුන් පුණ්‍යක්‍රියා, දොළොස් පුණ්‍යක්‍රියා සහ දස පුණ්‍යක්‍රියා වෙන වෙනම ලැයිස්තු ගත කරයි.
- පාසල තුළ දී ආගමික කටයුතු සංවිධානය කරයි.
- ආදර්ශවත් පුණ්‍යකාමී දිවියක් ගත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

පුණ්‍ය ක්‍රියා පිළිබඳ අවබෝධය ලබාදීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- කාව්‍ය ශේඛරයේ එන පින්කම් පිළිබඳ කියවෙන කවිවල මුල් කවි 2ක් හෝ 3ක් පන්තියට ඉදිරිපත් කරන්න.
- එහි අදහස විමසන්න.
- සුදුසු පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - සාමාන්‍යයෙන් අප ඉගෙන ගන්නේ දස පුණ්‍යක්‍රියා පිළිබඳව වුවත් දොළොස් ආකාර වූ පුණ්‍යක්‍රියා ගැන කාව්‍යශේඛරයේ සඳහන් බව
  - එක් එක් පුණ්‍ය ක්‍රියාවක් වෙන් වෙන් ව හඳුනා ගත යුතු බව
  - මෙම පුණ්‍ය ක්‍රියාවන්හි නිරතවීම මගින් දාන, සීල, භාවනා යන '' ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා'' සිදුවන බව
  - මෙම පුණ්‍ය ක්‍රියාවන්හි නිරතවීම මෙලොව පරලොව සුගතියට හේතු වන බව
  - මෙසේ කටයුතු කිරීම මගින් දැහැමි පුද්ගලයෙකු බිහිවන බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. කාව්‍ය ශේඛරයේ සඳහන් පුණ්‍ය ක්‍රියා ලැයිස්තු ගත කරන්න.

කණ්ඩායම 2. පාසල හා නිවසේ දී දොළොස් පුණ්‍ය ක්‍රියාවල නියැළෙන්නට හැකි අවස්ථා ලේඛන ගත කරන්න.

කණ්ඩායම 3. තුන් පුණ්‍යක්‍රියා, දස පුණ්‍යක්‍රියා සහ දොළොස් පුණ්‍යක්‍රියා වෙන වෙනම ලියා දක්වන්න.

**ගෙදර පරිසරයෙන් :**

දරුවන් ද යොමු කර ගනිමින් නිරතුරු පුණ්‍ය ක්‍රියාවන් හි නිරත වන්න.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය**

බුදුරජාණන් වහන්සේ ධරමාන සමයෙහි ම භාවිත කොට නිශ්චිත ප්‍රතිඵල විධිමත් ව ලබාගත් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදයක් අප සතු ව ඇත. බුද්ධ ධර්මය විෂය ඉගැන්වීමේ ක්‍රමවේදය තීරණය කිරීමේ දී සිසු නිපුණතා සංවර්ධනය වන පරිදි සැලසුම් සම්පාදනයට වැඩි අවධානයක් යොමු කර ඇති නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමයේ දී ගුරු භූමිකාවේ සුවිශේෂ වෙනසක් තුළින් ප්‍රබෝධාත්මක, සක්‍රීය ඉගෙනුම් ක්‍රියාවල යෙදෙන ඉගෙනුම්ලාභීන් ඔවුන්ට කේන්ද්‍ර ගත වූ ක්‍රියාවලියකට නිසැක වශයෙන් ම පත්වනු ඇත.

දැනට පන්ති කාමරයේ ක්‍රියාත්මක වන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය සිසු - සිසු අන්තර් සම්බන්ධතා සංවර්ධනය වන අයුරු සකස් විය යුතු වේ. සරලත්වයෙන් සංකීර්ණත්වයට, සංයුක්ත දෙයින් වියුක්ත දෙයට සිසුන් යොමු කිරීම ගුරුවරයාගේ කාර්යය වේ. මෙහිදී ගුරු භවතා සම්පත්දායකයකුගේ තත්වයෙන් ක්‍රියා කිරීම අත්‍යවශ්‍යයි. ඉගෙනුම් පරිසරය සැලසුම් කිරීම, සිසුන්ගේ ඉගෙනුම් නිරීක්ෂණය, ශිෂ්‍ය දක්ෂතා හඳුනා ගැනීම, ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබාදීම මෙන් ම පන්ති කාමරයෙන් බැහැරට ඉගෙනුම ව්‍යාප්ත වන අයුරු කටයුතු සංවිධානය ගුරුභවතාගෙන් ඉටු විය යුතු මූලික කාර්යයන් වේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පරිණාමන ගුරු භූමිකාව ගුරුවරයා වෙතින් ප්‍රදර්ශනය විය යුතු ය. විෂයමාලා ප්‍රතිසංස්කරණය යටතේ ඉදිරිපත් කරනු ලබන මෙම විෂයමාලාව හා සම්බන්ධ ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ දී පරිණාමන ගුරු භූමිකාවට අමතරව, සම්ප්‍රේෂණ හා ගනු දෙනු භූමිකාවන්හි ඇතුළත් වැදගත් ලක්ෂණ භාවිතයට ගැනීමට ද ගුරුභවතා සමත් විය යුතු ය.

බුද්ධ ධර්මය විෂය මගින් ධර්මය ආත්මීකරණය කොට දැහැමි ක්‍රියාකාරකම් මාලාවක් ජීවිත උරුමයක් සේ සම්පාදනය කිරීම සඳහා ගුරු දායකත්වය මහෝපකාරී වේ. එහි දී ධර්මයට අනුගත ව ජීවත්වීමේ අවශ්‍යතාව ප්‍රකටව සාකච්ඡා කෙරුණ ද, එය ජීවිත අත්දැකීමක් බවට පත්කර ගැනීම දකින්නට ලැබෙන්නේ අඩු ප්‍රතිශතයකිනි. ඒ නිසා පන්ති කාමරයේ ඉගැන්වෙන බුද්ධ ධර්මය විෂය අන්තර්ගතය, ඉන් බැහැර සමාජයේ දී ද සිය ජීවිතයට චරිතායනය කර ගැනීමට ශිෂ්‍ය ප්‍රජාවට මග පෙන්වීම අත්‍යවශ්‍ය ය. ඒ සඳහා යොමු විය හැකි ක්‍රමෝපායයන් කිහිපයක් මෙසේ දැක්විය හැකි ය.

- නිවසේ ආගමික වත් පිළිවෙත් හි නිරත කරවීම.
- පාසලෙහි ආගමික වතාවත්වලට ක්‍රියාකාරීව සහභාගිවීමට සැලැස්වීම.
- බෞද්ධ උත්සවයන්හි දී ආමිස පූජාවන්හි මෙන් ම ප්‍රතිපත්ති පූජාවෙහි වැඩි නැඹුරුවකින් නිරතවීමට විධිවිධාන යෙදීම.
- පාසල අයත් ප්‍රදේශයේ හෝ ශිෂ්‍යයා පදිංචි ප්‍රදේශයේ හෝ විහාරස්ථාන ඇසුරින් ආගමික කටයුතුවල නිරතවීමට මග පෙන්වීම.
- දහම් පාසල් අධ්‍යාපනයට නැඹුරු කරවීම.
- වැඩිහිටි නිවාස, රෝහල් ආදියේ උපස්ථාන කටයුතු හා ශ්‍රමදාන කටයුතුවලට යොමු කිරීම.

- පරිසරයේ වටිනාකම තේරුම් ගෙන ඒ අනුව කටයුතු කිරීමට සැලැස්වීම.
- සමාජ සුභසාධන ස්වේච්ඡා සමිති සමාගම්වලට සහභාගීවීමට හා ඒවායේ නිලතල දැරීමට උනන්දු කරවීම.

මේ ආදි ක්‍රමෝපායයන් මගින් පන්ති කාමරයේ ලබන ඉගෙනුම, ජීවිත අත්දැකීමක් බවට පත්කර ගැනීමට අවස්ථාව ලැබෙන අතර, එමගින් තහවුරු කර ගත හැකි සාරධර්ම චරිතායනය කර ගැනීමට අවස්ථාව සැලසේ. ඒ සඳහා ශිෂ්‍යයා යොමු කරවීම බුද්ධ ධර්මය විෂය උගන්වන ගුරු භවතාට පැවරෙන වැදගත් යුතුකමක් ද වේ.

**පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්**

1. සෑම පුර පසළොස්වක පෝය දින හෝ එම පෝයට පෙර දින හෝ සුවිශේෂ වූ ආගමික උත්සව සංවිධානය කිරීම.
2. පාසලේ / විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේලාගේ අවවාද අනුශාසනා ආගමික කටයුතුවලදී ලබා ගැනීම.
3. ආගමික වතාවත් ඉටු කිරීමේ දී ශිෂ්‍යයන්ගේ හැකියා සඳහා ප්‍රමුඛත්වය ලබා දීම.
4. සහයෝගය, සාමූහිකත්වය, අන්‍යෝන්‍ය ගෞරවය සුහද බව තහවුරු වන පරිදි ප්‍රායෝගික ක්‍රියාකාරකම් සැලසුම් කිරීම.
5. බෞද්ධ ශිෂ්‍ය සමිති පිහිටුවීම සහ ඒ මගින් ආදර්ශවත් නායකත්වයක් පුහුණු කිරීම.
6. අධ්‍යාපන චාරිකා, පර්යේෂණ ව්‍යාපෘති, දැනුම මිනුම තරග, චිත්‍ර ප්‍රදර්ශන, බිත්ති පුවත්පත්, වාර ප්‍රකාශන ආදී ක්‍රියාකාරකම් මගින් වැඩසටහන් සංවිධානය කිරීම.
7. දෙමාපියන් දැනුවත් කිරීමෙන් ශිෂ්‍ය හැකියා සංවර්ධනය කිරීම.

**තක්සේරුව හා ඇගයීම**

1. වාර අවසාන පරීක්ෂණ ඇසුරින් විෂය පිළිබඳ ශිෂ්‍ය සාධනයෙ හි විධිමත් ඇගයීමක් අපේක්ෂා කෙරේ.
2. සෑම පාඩමක දී ම ශිෂ්‍යයන්ගේ සාධනය පිළිබඳ තක්සේරු කිරීමට/ඇගයීමට විෂය භාර ගුරු භවතා උනන්දුවීම අත්‍යවශ්‍ය ය.
3. ඇගයීම පිළිබඳ ලිඛිත වාර්තා, ලිපිගොනු පවත්වා ගැනීම ද අවශ්‍ය වේ.
4. ප්‍රතිපෝෂණ වැඩ සටහන් සැලසුම් කිරීම ද අපේක්ෂා කෙරේ.
5. ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා ගුරු භවතාට යොදා ගත හැකි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.
   - සංකල්ප සිතියම්, බිත්ති පුවත්පත්, ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන්
   - ප්‍රශ්න සහ පිළිතුරු පොත්, ශිෂ්‍ය කාර්ය සාධන ගොනු, සිසු නිර්මාණ
   - ප්‍රදර්ශන, විවාද සාකච්ඡා මණ්ඩල, සම්මන්ත්‍රණ, ක්ෂණික කථා
   - භූමිකා රංගන, සාහිත්‍ය විමසුම් ඉදිරිපත් කිරීම, ක්ෂේත්‍ර පොත්
   - ස්වභාව අධ්‍යයන දින පොත්, සාධුචර්යා පුස්තක, ප්‍රායෝගික පරීක්ෂණ

**විවිධ සහාය**

**කාර්යාලයීය කටයුතු** : එස්. සී. ප්‍රියදර්ශනී මහත්මිය
කළමනාකරණ සහකාර
ජාතික අධ්‍යාපන ආයතනය

ඩයස් අමරසිංහ මහතා
කාර්යාල ආධාරක
ජාතික අධ්‍යාපන ආයතනය